අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும்
தொழிற் கல்வி அமைச்சு
Ministry of Education,
Higher Education and
Vocational Education





වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report
2024

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்
State Printing Corporation



රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2024

වාර්ෂික වාර්තාව

වාර්ෂික වාර්තාව,
ගිණුම් ප්‍රකාශන
සහ
විගණකාධිපතිගේ වාර්තාව

2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ 56 වෙනි වසර සඳහා
2024 ජනවාරි මස 01 වෙනි දින සිට 2024 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා

පටුන

	පිටු අංකය
පටුන	03
දැක්ම / මෙහෙවර	04
සභාපතිතුමාගේ පණිවිඩය / ඉදිරිපත් කිරීම	05 - 06
2024 අධ්‍යක්ෂ මණ්ඩලය	07
2024 නිළධාරී මණ්ඩලය	08
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව	09 - 14
සංවිධාන ව්‍යුහය	15
අනුකූලතා වාර්තාව	16 - 18
තිරසාර සංවර්ධන අරමුණු	19
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය	21
2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශණය	22
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය	23
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය	24
2024 දෙසැම්බර් 31 දා වන විට මූල්‍ය ප්‍රකාශවලට අදාල සටහන්	25 - 41
විගණකාධිපති වාර්තාව	43 - 50
විගණකාධිපති වාර්තාව පිළිබඳ අදහස් දැක්වීම	53 - 58

දැක්ම

මුද්‍රණ කර්මාන්තයේ
ප්‍රමුඛයාවීම සමඟින්
ප්‍රකාශනයෙන් විශේෂයෙන්
අධ්‍යාපන සංවර්ධන
ප්‍රකාශනයෙන්,
සුරකෂා මුද්‍රණ කර්මාන්තය,
අභ්‍යාස පොත් හා ලිපිදුව්‍ය
නිෂ්පාදන වෙළඳපොළේ
පුරෝගාමියා වීම.

මෙහෙවර

දැකෂ, නිපුණ, ධෛර්යමත්
හා තෘප්තිමත්
සේවක මණ්ඩලයකින් සමන්විත
ආදර්ශමත් රාජ්‍ය සංස්ථාවක්
ලෙස මුද්‍රණ කර්මාන්තයේ
උසස්ම ප්‍රමිතියට අනුව
තර්ගකාරී මිලකට
මුද්‍රිත නිෂ්පාදන
ජනතාවගේ අවශ්‍යතාවය හා
උන්නතිය සඳහා
සැපයීමට කැපවෙනු ඇත.

සභාපතිතුමාගේ පණිවිඩය



දශක 05 ක් ඉක්මවා අන්වර්ථ ගමන් මගක යෙදෙමින් සිය 57 වන ජන්ම දිනය සැමරූ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව සිය වාර්ෂික වාර්තාව හා හිණුම් ප්‍රකාශය සඳහා එහි සභාපතිවරයා ලෙස පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් සේ සලකමි.

පෙළපොත් ශ්‍රී ලාංකික දරුවන්ට නොමිලේ ලබාදීම සඳහා නොපමාව කටයුතු කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන 1968 අංක 24 දරන රජයේ මුද්‍රණ නීතිගත සංස්ථා පනතින් ආරම්භ කළ මෙම ආයතනය දරුවන්ට අවශ්‍ය පාසල් පෙළපොත් හා SPC වෙළඳ නාමය යටතේ ඉහළ ගුණාත්මයෙන් යුත් අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ප්‍රමුඛ කාර්යය අප විසින් ඉටු කරයි.

නව රජය බලයට පත් වූ පසු දූෂණයෙන් තොර රාජ්‍ය සේවයක් කරා යන ගමනේදී ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය හා එක්ව කාර්යක්ෂම හා ලාභදායී නිෂ්පාදන යාන්ත්‍රණයක් ඇති කරලීමේ අරමුණින් එස් 5 සංකල්පය මත පිරිසිදු, ආරක්ෂිත හා කාර්යක්ෂම සේවා පරිසරයක් නිර්මාණය කිරීමටත් භෞතික සම්පත් සංවර්ධනය සඳහා සංස්ථා පරිශ්‍රයේ ඇති සියලු ගොඩනැගිලි හා මහා මාර්ග නවීකරණයට ලක් කිරීමටත් කටයුතු කර ඇත.

මුද්‍රණ ක්ෂේත්‍රයේ නව මං සොයා යාමේදී ඩිජිටල්කරණය වූ මුද්‍රණයක් නිර්මාණය කිරීමට උත්සාහ දරන මොහොතක රාජ්‍ය මූල්‍ය ශක්තිමත් කරමින් සංස්ථාවේ ප්‍රථම වතාවට රාජ්‍ය බදු හා රාජ්‍ය භාගය නියමිත පරිදි ගෙවීමට අප සමත් වී ඇත. එමෙන්ම SLIM ආයතනය සමග ඒකාබද්ධව බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර ඇති අතර හා ශක්තිමත් ආර්ථිකයක් ළඟා කර ගෙන ඇති රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව තම ලාභ වැඩිකර ගනිමින් ආයතනයේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට කටයුතු කරමින් ඇත. සේවක සුබ සාධනය වැඩි කරමින් කාර්යක්ෂමතාව තවත් ඉහළ නැංවීමට උත්සාහ දරන මොහොතක මුද්‍රණයේ දැවැන්තයා ලෙස පෙනී සිටීමට ද අප බලාපොරොත්තු වේ.

මෙම සියලු කටයුතු කෙරේ අධීක්ෂණය කරමින් යා යුතු නිවැරදි දිශාව තෝරා ගැනීමට මා හට අත්වැලක් වූ අධ්‍යාපන අමාත්‍ය, ගරු ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය හරිනි අමරසූරිය මැතිණියත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නාලක කලුවැව මැතිතුමා හා ගරු අධ්‍යක්ෂ මණ්ඩලයත් සිහිපත් කරන්නේ ඉමහත් ගෞරවයෙනි.

එමෙන්ම ආයතනයේ සියලුම කාර්යයන් සාර්ථක කරගැනීමට මා හට සහාය දුන් සමස්ත කාර්ය මණ්ඩලයටද කෘතඥතාව පළ කරමි.

ටී. එම්. ඩී. එන්. උපිත බණ්ඩාර
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

පානළුව,
පාදුක්ක.

ගරු අග්‍රාමාත්‍ය හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

ගරු අග්‍රාමාත්‍යතුමියනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වෙනි වගන්තියේ කොන්දේසිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය ආවරණය කෙරෙන,

01. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව

02. විගනණය කරන ලද මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය හා විස්තීරණ ආදායම් ප්‍රකාශය ඇතුළු මූල්‍ය ප්‍රකාශන

03. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණන වාර්තාව සහ පිළිතුරු

ඔබතුමියගේ දැන ගැනීම සඳහා මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී

සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2024 අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති
ඒ. ඩී. නිමල් ධර්මරත්න මහතා

අධ්‍යක්ෂ මණ්ඩලය

1. පාලිත දේශප්‍රිය වීරසූරිය මහතා
2. තිලක් හෙට්ටිආරච්චි මහතා
3. කේ. එම්. එච්. බණ්ඩාර මහතා
4. පී. ආර්. අරුණ බිම්සර මහතා
5. ශෂික කරුණාදාස මහතා
6. නිමාලි ජයසුන්දර මහත්මිය
7. එන්. එම්. ආරච්චි මහතා

2024 විධායක නිලධාරී මණ්ඩලය

සාමාන්‍යාධිකාරී (වැ.බ.)
ඊ. වී. කේ. කීර්තිරත්න මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
ටී. එම්. ආර්. එන්. තෙන්නකෝන් මහතා

වැඩ කළමනාකරු
එස්. ඩී. කුමාරසිංහ මහතා

මුදල් කළමනාකරු (වැ.බ.)
එම්. එස්. එස්. මොහොට්ටි මහතා

කළමනාකරු (පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)
එම්. ඩී. එස්. රණතුංග මහත්මිය

සැපයුම් කළමනාකරු (වැ.බ.)
යූ. අනිල් ජයකාන්ත මහතා

අභ්‍යන්තර විගණක
ඩී. ඩී. නිරෝන් අමරසේන මහතා

නියෝජ්‍ය වැඩ කළමනාකරු
පී. කේ. ටී. මහින්ද මහතා

නියෝජ්‍ය වැඩ කළමනාකරු (සුරක්ෂා)
එම්. ඒ. කොතලාවල මහතා

සහකාර කළමනාකරු (විකුණුම්)
එච්. පී. ප්‍රියංකා විරසිංහ මහත්මිය

සහකාර කළමනාකරු (තොරතුරු තාක්ෂණ)
ආර්. එම්. ඒ. පී. බී. රාජකරුණා මහතා

සහකාර කළමනාකරු
(නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)
ඒ. එල්. ආර්. මධුකානි මහත්මිය

සහකාර කළමනාකරු (ප්‍රකාශන)
ඒ. ඩබ්. රාජසූරිය මහතා

සහකාර කළමනාකරු වැඩ (ලිපිද්‍රව්‍ය)
මයුර මධුශංක මහතා

සහකාර කළමනාකරු වැඩ (ප්‍රොසෙස්)
චතුරංග රත්නායක මහතා

සහකාර කළමනාකරු වැඩ (ලිතෝ)
කසුන් විමුක්ති මහතා

සහකාර කළමනාකරු වැඩ (නඩත්තු)
එන්. පී. එල්. චන්දිමාල් මහතා

ගණකාධිකාරී
ඩබ්. ඒ. ඒ. එස්. ජයසුන්දර මහතා

ගණකාධිකාරී
එන්. යූ. එස්. ද සිල්වා මහතා

2024

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

1971 අංක 38 දරන මුද්‍රල් පනතේ 14 වන වගන්තියේ කොන්දේසි ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ ක්‍රියාත්මක වූ වැඩ පිළිවෙළ ඇතුළත් සිය 56 වෙනි වාර්තාව රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් මෙසේ ඉදිරිපත් කරයි.

2024 වර්ෂයේ කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 09 ක් පවත්වන ලදී.


රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව පුරා වසර 55 ක කාලයක් විවිධ ආර්ථික සමාජීය සහ දේශපාලනමය පරිසරයන් තුල අඛණ්ඩව රාජ්‍ය ව්‍යාපාර ආයතනයක් ලෙස වර්තමානය දක්වා සාර්ථකත්වය කරා ගෙන ඒමට හැකිවීම අභියෝගාත්මක කාර්යයක් වුවද සංස්ථාවේ කළමනාකාරීත්වය ඇතුළු සේවක මණ්ඩලය එම අභියෝගය ජයගෙන ඇත. 2022 වර්ෂය දක්වා පුරා වසර 10 ක කාලයක් අලාභ ලබමින් පැවති සංස්ථාව 2023 වර්ෂයේ දී ඇතිකරගන්නා ලද මූල්‍ය ශක්තිය සමඟ 2024 වර්ෂය තුලද තම මෙහෙයුම් තුළින් මූල්‍ය ලාභයක් අත්පත් කර ගැනීමට හැකියාව ලැබුණි. සංස්ථාව විසින් පවතින සම්පත් හැකි උපරිම කාර්යක්ෂමතාවයකින් උපරිම ප්‍රයෝජන ගන්නා ආකාරයට මෙන්ම නාස්තිය සහ අපරිමැස්ම තුලින් මනා මූල්‍ය කළමනාකරණයකින් මෙහෙයවීම මත මෙම ප්‍රගතිය අත්පත්කරගෙන ඇත. පවතින නීතිරීති රෙගුලාසි සහ චක්‍රලේඛ සඳහා උපරිම ලෙස අනුගත වෙමින් මෙන්ම, ප්‍රායෝගික තත්ත්වයන් මත තරඟකාරී ප්‍රවේශයන් සඳහා තීරණ ගනිමින් පෞද්ගලික අංශය සමඟ ගැටෙමින් විවිධ කළමනාකරණ ශිල්පයන් භාවිතා කරමින් අරමුණ සාක්ශාත් කරගැනීම සඳහා 2024 වර්ෂයේදී සංස්ථාව විසින් කටයුතු කර ඇත. සංස්ථාවේ ප්‍රධාන ව්‍යාපාර ඒකකවල වර්ෂය ආරම්භයේ ස්ථාපිත ඉලක්ක ලඟාකර ගැනීම සඳහා හැකි උපරිම වශයෙන් ලඟාකර ගැනීමට විවිධ උපාය මාර්ගයන් මෙන්ම විවිධ ආයතන සම්බන්ධීකරණය කරමින් ඔවුන් වෙත ගුණත්වයෙන් ඉහළ මුද්‍රණ නිෂ්පාදනයන් ලබාදීමට 2024 වර්ෂය තුළ හැකියාව ලැබිණි. සංස්ථාවේ මානව හා භෞතික ප්‍රාග්ධනය සංවර්ධනය වෙනුවෙන් මනා පිරිමැසුම්දායී ලෙස අරමුදල් ආයෝජනය කරමින් ඉදිරි අනාගතය සඳහා සැලසුම් සකස්කරමින් සංස්ථාව මෙහෙයවීමට 2024 වර්ෂයේ දී හැකියාව ලැබිණි. 2024 වර්ෂය තුළ රුපියල් බිලියන 2.7 කට ආසන්න ආදායමක් උප්පාදනය කරමින් රුපියල් මිලියන 284 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට හැකියාව ලැබුණි. එමෙන්ම රුපියල් බිලියන 3.7 කට ආසන්න මුළු වත්කම් සහිත රාජ්‍ය ආයතනයක් ලෙස රජයට වත්කමක් රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව එක්කර ඇත. එම වත්කම් මූල්‍යනය සඳහා වර්ෂය අවසානයේ කෙටිකාලීණ ණය හෝ දිගු කාලීණ ණය මූල්‍යන උපකරණයක් ලෙස භාවිතා වී නොමැත. සංස්ථාවේ විෂයපථය තුල දැනට ක්‍රියාත්මක වන ප්‍රධාන ව්‍යාපාර ඒකකවලට අමතරව ඉදිරි වර්ෂ 5 තුල ලබාගැනීමට අපේක්ෂිත ඉලක්ක සඳහා උපායමාර්ගික සැලැස්මක් මඟින් ව්‍යාපාර විවිධාංගීකරණය සඳහා වර්තමාන කළමනාකාරීත්වය විසින් සැලැසුම් සකස්කරමින් පවතී. ඒ සඳහා වර්තමාන කළමනාකාරීත්වය ඊට අදාළ ප්‍රවේශයන් සඳහා වූ මූලික කටයුතු සිදුකරමින් පවතී. විශේෂයෙන්ම ආරක්ෂිත මුද්‍රණ කටයුතු ආශ්‍රිත නව ආයෝජනයන් සම්බන්ධව පවතින යෝජනා අනුව ඊට අදාළ ප්‍රවේශයන් සඳහා වූ මූලික කටයුතු සිදුකරමින් පවතී. විශේෂයෙන්ම ආරක්ෂිත මුද්‍රණ කටයුතු ආශ්‍රිත නව ආයෝජනයක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරමින් පවතින අතර, දැනට සංස්ථාවේ ක්‍රියාත්මක අංශවලට කාර්ය සාධන දර්ශකයන් හඳුන්වා දෙමින් කාර්ය සාධනය ඉහල නැංවීම සඳහා ක්‍රියාමාර්ග මෙම වර්ෂය තුල ආරම්භ කර ඇත. එමෙන්ම සංස්ථාවේ මානව සම්පත් සංවර්ධනය, සේවක සුභ සාධනය සහ ධාරිතාවය සංවර්ධනය කිරීම මෙන්ම, එදිනෙදා නඩත්තු කටයුතු සඳහා ද වත්කම් ආරක්ෂාව, ආදී කරුණු සැළකිල්ලට ගෙන, ඊට අවශ්‍ය මූලික ප්‍රතිපාදන වෙන්කිරීම් සහ සැලසුම් 2024 වර්ෂයේ දී සිදුකරන ලදී. සංස්ථාව විසින් 2024 වර්ෂය තුල ඒ ඒ ව්‍යාපාර අංශ තුලින් ලබාගත් ප්‍රගතිය සහ අනෙකුත් තොරතුරු ඇතුලත් සාරාංශ වාර්තාවක් මේ සමඟ ඉදිරිපත් කරමි.


01. නිෂ්පාදන අංශය


1.1 පාසල් පෙළපොත් මුද්‍රණය

2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රුපියල් බිලියන 4කට ආසන්න පෙළපොත් මුද්‍රණ ආදායමක් අපේක්ෂා කරන ලදී. සංස්ථාවේ පවතින ව්‍යාපාර අංශවලින් සංස්ථා ආදායමට 50% කට වැඩි දායකත්වයක් එම අංශය මගින් උපයා දෙන අතර, ඒ අනුව 2025 වර්ෂය සඳහා මුද්‍රණය කරනු ලබන පෙළපොත් සමස්ථ ප්‍රමාණයෙන් 40% ක ප්‍රමාණයක් 2024 වර්ෂයේ මුද්‍රණය කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබාගන්නා ලදී. ඒ අනුව 1, 6, 10 ශ්‍රේණි හැර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරනු ලබන සමස්ථ පෙළපොත් ප්‍රමාණයෙන් 40%ක ප්‍රමාණයක් එනම් පිටපත් මිලියන 7.6ක් මුද්‍රණය කිරීමට සංස්ථාවට හැකිවිය. ඒ තුලින් 2024 වර්ෂයේ දී සංස්ථාව රුපියල් මිලියන 1802.3 ක ආදායමක් මෙම ව්‍යාපාර ඒකකය තුලින් උපයා ගන්නා ලද අතර ව්‍යාපාර ඒකකයක් ලෙස එම අංශයෙන් රුපියල් මිලියන 597 ක දළ ලාභයක් උපයා ගන්නා ලදී. ඒ සඳහා වාණිජ මුද්‍රණ ආදායම රුපියල් මිලියන 294.9 ක දායකත්වයක් එම අංශයෙන් ප්‍රධාන මුද්‍රණාලය වෙත ලැබී ඇත. 2024 වර්ෂයේ දී 1, 6, 10 ශ්‍රේණිවලට මොඩියුල මුද්‍රණය සඳහා පෙළපොත් මුද්‍රණ කටයුතු සම්බන්ධව නිශ්චිත තීරණයක් ගන්නා තෙක් තාවකාලිකව නැවැත්වීම මත සංස්ථාව විසින් අපේක්ෂා කල පෙලපොත් පිටපත් මිලියන 10-13 අතර ප්‍රමාණය නොලැබීම හේතුවෙන් අපේක්ෂිත ආදායම ලඟා කර ගැනීමට මෙම ව්‍යාපාර අංශයෙන් නොහැකි වුවද සංස්ථාව විසින් කල්වේලා ඇතිව මනා සැලසුමකින් අමුද්‍රව්‍ය ආයතනයේ සිට අවසන් නිෂ්පාදනය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ගබඩාව වෙත භාරදීම දක්වා ඉටුකිරීම හේතුවෙන් එම අංශයේ කාර්ය සාධනයක් ලඟාකර ගැනීමට හැකියාම ලැබී ඇත. සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂ 2ක පාසැල් පෙළපොත් මුද්‍රණයට අදාළ තොරතුරු ඇතුලත් සාරාංශය පහත දැක්වේ.

පාසල් පෙළපොත් මුද්‍රණ වැඩ	2022 ('000)	2023 ('000)	2024 ('000)
පිටපත් සංඛ්‍යාව	-	23,928	7,254
ආදායම - රු.	41,569	7,470,886	1,802,375









1.5 ප්‍රකාශන සහ වෙනත් ලිපිද්‍රව්‍ය අයිතම විකුණුම් අංශය

2023 වර්ෂයට සාපේක්ෂව වෙනත් ලිපිද්‍රව්‍ය විකුණුම් අංශයේ සුවිශේෂී වූ ප්‍රගතියක් අත්පත් කර ගැනීමට 2024 වර්ෂයේ දී සංස්ථාවට හැකියාවක් ලැබුණු අතර එය 2023 වර්ෂයේ දී මිලියන 1.7ක් වූ ආදායම 2024 වර්ෂයේ දී මිලියන 17.2 ක් දක්වා වර්ධනයක් ලඟාකර ගැනීමට හැකිවිය. ඒ සඳහා ප්‍රධාන හේතු ලෙස කාරක ප්‍රාග්ධන ගැටළු අවම වීමත් සමග බාහිර ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමේ ශක්‍යතාවය වර්ධනය වීමෙන් එම ප්‍රගතිය ලඟාකර ගන්නා ලදී.

02. සංස්ථාවේ මූල්‍ය තත්ත්වය

2023.12.31 දිනට සංස්ථාවේ පැවැති මූල්‍ය තත්ත්වය අනුව සමස්ථ වත්කම් වල වටිනාකම රුපියල් බිලියන 4ක් වූ මුළු වත්කම් 2024 වර්ෂයේ දී රුපියල් බිලියන 3.7 දක්වා අඩුවී ඇත. එයට ප්‍රධාන හේතුව ලෙස ණය ගැතියන්ගේ වටිනාකම රුපියල් මිලියන 400කින් අඩුවීම බලපා ඇත. එමෙන්ම සංස්ථාව තම මෙහෙයුම් තුලින් රුපියල් මිලියන 97.9ක බදු පසු ලාභයක් උපයා ඇති අතර බැංකුව වෙත ඇති වගකීම් සම්පූර්ණයෙන් ගෙවා දමා මූල්‍ය ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීමට හැකියාව ලැබී ඇත. එමෙන්ම 2023 වර්ෂයට අදාළව රුපියල් මිලියන 631කට ආසන්න ආදායම් බදු ගෙවා දැමීමට සංස්ථාවට හැකි වූ අතර වැට් බදු පුද්ගල අත්තිකාරම් ආදායම් (APIT) හා සමාජ ආරක්ෂණ බදු (SSCL) මුද්දර බදු ආදී බදු ගෙවීම් වියමන් කිරීමට සංස්ථාවට හැකි විය.


03. මූල්‍ය පහසුකම්

සංස්ථාවේ ප්‍රධාන බැංකුවක් ලෙස මහජන බැංකුව කටයුතු කරන අතර මහජන බැංකුව විසින් සංස්ථාවේ ව්‍යාපාර කටයුතු සඳහා මූල්‍ය පහසුකම් කෙටි කාලීන, දිගු කාලීන ඇපකර අයිරා වශයෙන්ම රුපියල් මිලියන 1165 මූල්‍ය පහසුකමක් ලබා දී ඇත. ඒ සඳහා සුරක්ෂණ ලෙස සංස්ථාවේ ඉඩම් මෙන්ම මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති භාණ්ඩාගාර ඇපකරයක් පදනම් කරගෙන මෙන්ම මූල්‍ය පහසුකම් සපයනු ලැබේ. එම ඇපකරය 2026. 09. 15 දක්වා බලපැවැත්වේ.

04. සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය

2023 වර්ෂයේ දී ගිණුම් අනුව රුපියල් මිලියන 2161ක බදු පසු ලාභයක් උපයා ඇති අතර 2024 වර්ෂයේ දී ඉපයූ බදු පසු ලාභය රුපියල් මිලියන 97.7 ක් දක්වා පසු බෑමක් වාර්තා කළ ද 2023 වර්ෂයේ ලාභය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලට සාපේක්ෂව ව්‍යතිරේකී අවස්ථාවක් වේ.

ලාභදායිතාව	2022 රු. ('000)	2023 රු. ('000)	2024 රු. ('000)
බදු පූර්ව ලාභය	(380,702)	2,794,248	284,371
බදු ප්‍රතිපාදනයෙන් පසු	(380,702)	2,030,569	97,913



05. සංස්ථාවේ සේවක සුබසාධන කටයුතු

පෙර වර්ෂවල මෙන් සංස්ථාවේ සමස්ථ සේවක මණ්ඩලය අභිප්‍රේරණය කිරීමේ අරමුණින් ඔවුන්ගේ සුබසාධනය ඉහළ නැංවීම සඳහා දිරි දීමනා, වෛද්‍ය පහසුකම් හා සුබසාධන වැඩසටහන් කළමණාකාරීත්වයේ තීරණ මත ක්‍රියාත්මක කරන ලදී. ඒ සඳහා සංස්ථා අරමුදලින් දැක්වූ දායකත්වය පිළිබඳව සාරාංශයක් පහත දැක්වේ.

	සුභ සාධනය	2022 රු. ('000)	2023 රු. ('000)	2024 රු. ('000)
01.	සේවක ප්‍රවාහන පහසුකම්	4,266	7,699	5,813
02.	සේවක දිරි දීමනා ගෙවීම්	1,733	52,572	43,651
03.	වෛද්‍යාධාර ප්‍රතිලාභ ගෙවීම	5,118	5,061	21,569
04.	සේවක විවිධ සුභ සාධනය (ඉතිරිකරගත් නිවාඩු මත ගෙවීම්)	8,409	13,938	15,201
05.	සේවක නිවාස ණය ප්‍රතිපූරණය	719	964	1,709
	එකතුව	**20,245**	**80,054**	

06. කාර්ය මණ්ඩල තොරතුරු

සංස්ථාවේ 2023 වර්ෂයේ ඉහළ කළමනාකාරීත්වයේ සිට කණිෂ්ඨ සේවක මණ්ඩලය දක්වා පුරප්පාඩු සඳහා අභ්‍යන්තර වශයෙන් සුදුසුකම් ලද නිළධාරීන් 140කට ආසන්න ප්‍රමාණයක් සඳහා බඳවා ගැනීම් සිදු කරන ලදී. එමගින් බාහිරින් සේවකයින් බඳවා ගැනීමේ අතිරේක වැය ඇතිවීම වැළැක්වීම සඳහා කළමනාකාරීත්වය විසින් අදාළ අභ්‍යන්තර උසස් කිරීම් සිදු කර සේවක අවශ්‍යතාවයන් සපුරා ගැනීමට කටයුතු කර ඇත. 2024. 12. 31 දිනට සංස්ථාවේ සේවක සංයුතිය හා ප්‍රමාණය ඇතුලත් සාරාංශයක් පහත දැක්වේ.

සේවක වර්ගීකරණය	අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	29	19	10
තෘතීය මට්ටම	29	17	12
ද්විතීය මට්ටම	329	199	130
ප්‍රාථමික මට්ටම	295	221	74
එකතුව	682	456	206



07. සමාප්තිය

2024 වර්ෂය රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ මෙහෙයුම් කටයුතු වල සාමාන්‍ය ව්‍යාපාර පරිසරයක් සහිත මෙන්ම, තරගකාරී වෙළඳපලක් තුල ක්‍රියාත්මක වූ අතර එම මෙහෙයුම් මගින් බදු පසු ලාභයක් උපයා ගැනීමට හැකිවීම රාජ්‍ය සංස්ථාවක් ලෙස අප ලද ජයග්‍රහණයකි. මේ සඳහා ගරු අග්‍රාමාත්‍ය හා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යතුමිය, නියෝජ්‍ය අධ්‍යාපන අමාත්‍යතුමා, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමා සහ මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සහයෝගය නොමඳව ලැබුණි. එමෙන්ම සංස්ථාවේ සේවක මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු කළමනාකාරීත්වයේ කැපවීම මෙම සාර්ථකත්වය සඳහා මනා පිටුවහලක් වී ඇත. ඉදිරි වසර 05 ක අපේක්ෂිත සැලසුම් අනුව රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව අඛණ්ඩව ලාභදායී රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස ඉදිරියටත් පවත්වාගෙන යාමට ශක්තිය ධෛර්ය හා වාසනාව ලැබේවා යි අපි ප්‍රාර්ථනා කරමු.

Annexures:

Organizational Chart of SPC

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරණ ක්‍රියාමාර්ග
1.	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	කාර්ය සාධන වාර්තා	අනුකූල වේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ. රෙ. 445)**			
2.1	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ. රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට අධ්‍යක්ෂ මණ්ඩලයට නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
5	විගණන විමසුම			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනය, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විමසුම			
6.1	වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7.	විගණන හා කළමනාකරන කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම	අනුකූල වේ		
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම		අනුකූල නොවේ	මෙය 2024 වර්ෂයේ නිවැරදි කිරීම් කිරීමට කටයුතු කෙරේ.
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම		අනුකූල නොවේ	මෙය 2024 වර්ෂයේ නිවැරදි කරනු ඇත
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 සහ 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	ඉන්ධන භිඟය හේතුවෙන් පරීක්ෂාව සිදුකළ නොහැකි විය	2023 වර්ෂයේ සිට නියමිත පරිදි ඉන්ධන දහනය වීම් පරීක්ෂා කිරීම සිදු කෙරේ.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිලියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**මානව සම්පත් කළමනාකරණය**			
11.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම		අනුකූල නොවේ	2024 වර්ෂයේ නිවැරදි කරනු ඇත.
11.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
12	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
12.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙක යාම			
12.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම		අනුකූල නොවේ	වෙබ් අඩවිය සංවර්ධනය කරමින් පවතී
13	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
13.1	මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම		අනුකූල නොවේ	මෙය 2024 වර්ෂයේ සම්පූර්ණ කරනු ලැබේ.
13.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම		අනුකූල නොවේ	පුහුණු අවස්ථා ලබාදීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති විය.
13.3	සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන කර තිබීම		අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී	අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී
13.4	මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
14.	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
14.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීම

1968 අංක 24 දරණ රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථා පනතෙන් ස්ථාපිත රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ ප්‍රධාන අරමුණු අතර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ පාසල් දරුවන් සඳහා නොමිලේ බෙදා හරිනු ලබන පාසල් පෙළපොත් මුද්‍රණය, රාජ්‍ය අංශයේ ආයතන සඳහා අවශ්‍ය මුද්‍රණ කටයුතු ඉටු කර දීම වැනි අරමුණු ප්‍රධාන වේ. රටේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා රජය විසින් නොමිලේ ලබා දෙනු ලබන පාසල් පෙළපොත් ඉතා ගුණාත්මයෙන් සහ උසස් මට්ටමෙන් අඩු පිරිවැයකින් නිෂ්පාදනය කර සමස්ත දරු පරපුර සඳහා ලබාදීමට කටයුතු කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන සංස්ථාව කටයුතු කරයි.

2024

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය

	සටහන්	2024 රු.	2023 රු.
ආදායම	8	2,788,555,974	8,323,244,160
විකුණුම් පිරිවැය	9	(2,088,940,756)	(4,902,908,871)
අ.ප.දෙ./ජා.ලො.ම. ගුණත්වය අඩුවීම සහ ප්‍රමාද ගාස්තු		(1,439,410)	(27,700,143)
දළ ලාභය		**698,175,808**	**3,392,635,146**
වෙනත් මෙහෙයුම් ආදායම	10	48,590,769	94,493,667
විකුණුම් සහ බෙදාහැරීමේ වියදම්	11	(44,584,545)	(37,703,712)
ආයතන සහ පරිපාලන වියදම්	12	(283,886,561)	(222,342,589)
වෙනත් මෙහෙයුම් සඳහා වියදම්	13	(76,713,906)	(74,210,585)
මෙහෙයුම් ලාභය		**341,581,566**	**3,152,871,926**
මූල්‍ය ආදායම	14	10,674,390	14,834,896
වෙනත් ආදායම් - මහා භාණ්ඩාගාර ප්‍රධානය (2023 හානිකරණය කපා හැරීම)		31,122,237	31,122,237
මූල්‍ය වියදම්	14.1	(39,908,729)	(229,657,771)
SSCL		(59,098,013)	(176,841,478)
වර්ෂයේ බදුපෙර ඌනතාවය/අතිරික්තය		**284,371,451**	**2,792,329,810**
ආදායම් බදු	15	(115,784,270)	(630,688,648)
Deferred Tax	29	(70,673,946)	
වර්ෂයේ බදුපසු ඌනතාවය/අතිරික්තය		**97,913,235**	**2,161,641,161**
වෙනත් විස්තීරණ ආදායම්			
පරිගණක විකිණීම ලාභය/පාඩුව		10,392,863	
ඉඩම් විකිණීම ලාභය/පාඩුව			534,400,000
වාහන විකිණීම ලාභය/පාඩුව			66,099,975
වර්ෂය සඳහා බදු අතිරික්තය/ඌනතාවය		**108,306,098**	**2,762,141,136**

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන

	සටහන	2024 රු.	2023 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ		1,630,156,673	1,714,035,288
අස්පෘෂ්‍ය වත්කම්			3,596,640
එකතුව ජංගම නොවන වත්කම්	16	**1,633,753,313**	**1,714,035,288**
ජංගම වත්කම්			
තොගය	17	1,361,403,978	1,259,427,556
වෙළඳ ලැබිය යුතු ශේෂය	18	539,568,941	936,518,912
වෙනත් ලැබිය යුතු ශේෂයන්	19	80,596,035	27,252,915
පූර්ව ගෙවීම්		7,826,669	1,632,858
බැංකු ස්ථාවර තැන්පතු (කෙටි කාලීන)		-	
ලැබිය යුතු බැංකු පොලී (ස්ථාවර තැන්පතු සඳහා)			
මුදල් හා මුදල්වලට සමාන දෑ	20	117,473,259	117,844,459
මුළු ජංගම වත්කම්		**2,106,868,882**	**2,342,676,701**
මුළු වත්කම්		**3,740,622,195**	**4,056,711,989**
ස්කන්ධය හා බැරකම්			
ප්‍රාග්ධන නිකුතුව		15,000,000	15,000,000
එකතු කළාඃ ප්‍රත්‍යාගණන ලාභ		1,312,244,490	1,301,851,627
රඳවා ගත් ඉපයීම්		1,084,089,360	987,263,070
මුළු ස්කන්ධය		**2,411,333,849**	**2,304,114,697**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්		263,393,881	192,758,668
බැංකු ණය - දිගු කාලීන			-
මහා භාණ්ඩාගාර ප්‍රධානය - යන්ත්‍ර සඳහා		324,387,475	355,509,711
එකතුව ජංගම නොවන බැරකම්		**587,781,355**	**548,268,379**
ජංගම බැරකම්			
වෙළඳ ගෙවිය යුතු ශේෂයන්	21	60,619,922	107,030,942
වෙනත් ගෙවිය යුතු ශේෂයන්	22	112,160,950	65,389,937
බදු ගෙවිය යුතු ශේෂයන්	23	392,267,901	339,857,169
ආදායම් බදු වෙන්කිරීම් - 2024		105,784,270	630,688,648
විලම්භිත බදු වෙන්කිරීම් - 2024		70,673,946	
පොලී ගෙවිය යුතු ණය		59,032,000	
ණයවර ලිපි සඳහා (බැංකු ණය)		2,330,218	
මුළු ජංගම බැරකම්		**741,506,990**	**1,204,328,914**
මුළු ස්කන්ධය හා බැරකම්		**3,740,622,195**	**4,056,711,989**

සංස්ථාවේ මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මූල්‍ය පනතේ අවශ්‍යතාවන්ට අනුකූල බව සහතික කරමු.

.....
එම්. එස්. එස්. මොහොට්ටි
මුදල් කළමණාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා තිබේ. පිටු අංක 06 සහ 10 හි ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 10 මෙන්ම 26 දක්වා ඇතුළත් අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත්ම අංග වේ.

.....
ටී. එම්. ඩී. එන්. උජිත බණ්ඩාර
සභාපති/අධ්‍යක්ෂ

.....
නන්දන කුමාර
අධ්‍යක්ෂ

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රාග්ධන නිකුතුව රු.	යන්ත්‍ර සඳහා රජයේ ප්‍රධාන රු.	ප්‍රත්‍යාගණන ලාභය රු.	රඳවාගත් ඉපැයීම් රු.	එකතුව රු.
2023 ගිණුම්					
2023. 01. 01 වැනි දිනට ශේෂය	15,000,000	386,631,948	701,351,652	(1,163,063,862)	(60,080,262)
පෙර වර්ෂයේ ගැළපීම් - වෙනත්				11,314,233)	(11,314,233)
2022 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රධාන ක්ෂයකිරීම්		(31,122,237)			(31,122,237)
ප්‍රත්‍යාගණන ලාභය - 2023 - ඉඩම්			534,400,000		532,491,630
- රථවාහන			66,099,975		66,089,975
ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු)				2,161,641,165	2,030,569,355
2023. 12. 31 දිනට ශේෂය	**15,000,000**	**355,509,711**	**1,301,851,627**	**987,263,070**	**2,526,634,228**
2024 ගිණුම්					
2024. 01. 01 දිනට ශේෂය	15,000,000	355,509,711	1,301,851,627	987,263,070	2,526,634,228
පෙර වර්ෂයේ ගැළපීම් / Add				(1,086,945)	(1,086,945)
2024 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රධාන ක්ෂයකිරීම්		(31,122,237)			(31,122,237)
ප්‍රත්‍යාගණන ලාභය - 2024 - පරිගනක			10,392,863		10,392,863
ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු)				97,913,235	97,913,235
2024. 12. 31 දිනට ශේෂය	**15,000,000**	**324,387,475**	**1,312,244,490**	**1,084,089,360**	**2,602,731,143**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2024 රු.	2023 රු.
මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය		
බදු පෙර ලාභය/අලාභය	**284,371,451**	**2,794,248,182**
ගැළපීම්:		
ස්ථාවර වත්කම් ක්ෂය	105,439,186	84,175,871
වෙනත් ආදායම් - 2022 භාණ්ඩාගාර ප්‍රදානයන්	(31,122,237)	(31,122,237)
පෙර වර්ෂයේ ගැළපීම් (මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ බලපෑම)	(1,086,945)	(11,314,232)
මූල්‍ය වියදම්	39,908,729	229,657,771
ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළිය		2,948,214
ස්ථාවර තැන්පතු ගෙවිය යුතු ණය පොලී		(2,062,123)
පාරිතෝෂික සඳහා වසර තුළ වෙන්කළ ප්‍රතිපාදන	90,967,985	58,518,274
අයකරගත නොහැකි ණයහිමි ප්‍රතිපාදන	4,662,324	4,579,788
තක්සේරුගත ලාභය		(1,918,370)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**493,140,493**	**3,127,711,139**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්		
තොගය (වැඩිවීම) / අඩුවීම	(101,976,422)	(1,063,349,605)
(වැඩිවීම්)/වෙළඳ ලැබීම් අඩුවීම	392,287,647	(760,744,634)
(වැඩිවීම්)/වෙනත් ලැබීම්වල හා පෙර ගෙවීම්	(59,536,931)	(9,551,037)
ජංගම බැරකම්වල වැඩි/(අඩුවීම)	50,440,510	(6,296,348)
මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය	774,355,297	1,287,769,515
සේවක විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම	(20,332,772)	(11,553,270)
මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ ශුද්ධ මුදල් ප්‍රවාහය	**754,022,525**	**1,276,216,245**
බදු ගෙවීම් 2023-2024	(630,688,648)	
බදු ගෙවීම් 2024	(10,000,000)	
බදු ගෙවීම්	(640,688,648)	
ආයෝජන කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය		
ස්ථාවර වත්කම් මිලදී ගැනීම් තුලින් ජනනය වූ	(14,764,348)	(24,898,969)
ස්ථිර තැන්පතු	25,636,644	
ආයෝජන කටයුතුවලින් ශුද්ධ මුදල් ගලාඒම	**(14,764,348)**	**737,676**
මූල්‍ය කටයුතුවලින් මුදල් ගලා ඒම		
ණය ලබා ගැනීම/ගෙවීම් තුලින් (ශුද්ධ ණය)	(59,032,000)	(882,377,259)
පොළී ගෙවීම්	(39,908,729)	(229,657,771)
ස්ථාවර තැන්පතු වෙනුවන් ලබාගත් ණය		(23,000,000)
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ගලා ඒම	**(98,940,729)**	**(1,135,035,030)**
ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්) මුදල් හා මුදල්වලට සමාන දෑ	**(371,201)**	**141,918,890**
කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන දෑ	**117,844,459**	**(24,074,431)**
කාලසීමාව අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ (සටහන 19)	**117,473,258**	**117,844,459**

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
2024 දෙසැම්බර් 31 වැනිදා වන විට

1. සංස්ථාව පිළිබඳ තොරතුරු

1.1 වාර්තාකරණ ආයතනය

1968 අංක 24 දරන පාර්ලිමේන්තු පනතට අනුව රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව 1968 වසරේදී ස්ථාපනය කරන ලද අතර, එය පසුව 1978 අංක 24, 1981 අංක 51 සහ 1998 අංක 07 දරණ සංශෝධනයන්ට අනුව සංස්ථාපනය කෙරිණි. ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය එහි කළමනාකාරීත්වය භාරව ක්‍රියා කරයි. පාදුක්ක, පානළුව ප්‍රදේශයේ මෙය පිහිටා තිබේ.

1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම්වල ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ පාසල් පෙළ පොත් මුද්‍රණය, අභ්‍යාස පොත් නිෂ්පාදනය හා වෙනත් මුද්‍රණ කාර්යයන් සිදු කිරීමයි.

1.3 නිකුත් කිරීම සඳහා අවසර ලබා දුන් දිනය

2024 දෙසැම්බර් 31 ව දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනය නිකුත් කිරීම සඳහා 2024. 02. 21 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර ලබා දෙන ලදී.

2. ගිණුම් ප්‍රමිතීන් හා පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් පිළිබඳ පුළුල් ප්‍රකාශනය, අරමුදල් හා මුදල් ගලා ඒමේ වෙනස්කම් සහ ප්‍රතිපත්ති මෙන්ම සටහන් සකසා ඇත්තේ LKAS සහ SLFRS යන ගිණුම්කරණ ප්‍රමිතීන් හා 1971 අංක 38 දරන මූල්‍ය පනතට අනුවය.

2.2 ඇඟයුම් පදනම්

පහත සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබෙන්නේ ඓතිහාසික පිරිවැය පදනම් කර ගෙනය.

* විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සඳහන් පොළී ආදායම
* ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්
* ප්‍රක්ෂේපණ ඒකක ක්‍රමය මගින් සේවක ප්‍රතිලාභ මැන ඇත.

2.3 අඛණ්ඩ පැවැත්ම

2024 වර්ෂය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු මෙහෙයුම් වර්ෂයක් වන අතර සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම්වලින් ලාභ උපයනු ලැබේ. ඉදිරි කාලය තුළ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය සම්පත් තමන් සතුව පවතින බවට කළමනාකාරීත්වය සෑහීමකට පත්වේ. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් සම්බන්ධව කළමනාකාරීත්වය දැනුවත් වී නොමැත. එම නිසා මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පැවැත්වීමේ පදනම මත සකස් කිරීම අඛණ්ඩව සිදුකරගෙන යයි. කෙසේ වෙතත් අනාගතයේදී අවදානම අවම කිරීම සඳහා පෙළපොත් මුද්‍රණය (ප්‍රධාන මුද්‍රණාලය) ප්‍රධාන උපාය මාර්ගික ව්‍යාපාර ඒකකය තවදුරටත් විවිධාංගීකරණය කළයුතු බව මණ්ඩලය අදහස් කරයි.

2.4 භාවිතාවන ව්‍යවහාර මුදල්

අවසාන ගිණුම් ඉදිරිපත් කර ඇත්තේ සංස්ථාවේ ව්‍යවහාර මුදල් වූ ශ්‍රී ලංකා රුපියල්වලිනි.
සියලුම මූල්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ රුපියල්වලින් වන අතර ආසන්න රුපියලේ අගයට වටිනාකම් දක්වා ඇත.

2.5 සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව විසින් කලින් අවුරුදුවල අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තීන් නොවෙනස්ව ඒ ආකාරයෙන් අනුගමනය කර ඇත. අවශ්‍ය අවස්ථාවල කලින් අවුරුදුවල වටිනාකම් හා සඳහන් කිරීම් නැවත සකසා ඉදිරිපත් කිරීම් කර ඇත. සංස්ථාව විසින් ඉකුත් වර්ෂවලට අදාළ වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගළපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්වය නැවත ප්‍රකාශ කර ඇත.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

3.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ සඳහන් කර ඇත්තේ එකතු ක්ෂයවීම් අඩු කරන ලද ශුද්ධ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම වේ.

පහත සඳහන් දිනවල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වත්කම් තක්සේරු කරන ලදී.

ඉඩම් හා ගොඩනැගිලි - 02. 01. 2017 සිට 06. 01. 2017 දක්වා

කාර්යාලයීය උපකරණ, ලී බඩු හා සවිකිරීම් පරිගණක උපාංග - 02. 01. 2017 සිට 30. 01. 2017 දක්වා

යන්ත්‍ර හා පිරියත - 16. 01. 2017 සිට 30. 01. 2017 දක්වා

ර.මු.නී.ස. විසින් පත් කරන ලද ප්‍රත්‍යාගණන කමිටුව

මෝටර් රථ හා අනෙකුත් රථවාහන - 2023.12.27 සිට 2023.12.28 දක්වා

පරිගණක හා උපාංග - 2024.01.01 සිට 2024.12.28 දක්වා

සංස්ථාවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සලකා බැලීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි නියම කර ඇති පරිදි වත්කම් සෑම වසර දෙකකට වරක් ප්‍රත්‍යාගණනය කළ නොහැක. කෙසේ වෙතත් 2023/2024 සිට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගැනීමට කටයුතු කර ඇත. සංස්ථාව විසින් මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය කළ අතර ප්‍රත්‍යාගණන වටිනාකම 2023 ගිණුම්වල දක්වා ඇත. පරිගණක උපාංග සහ උපාංග ප්‍රත්‍යාගණනය කර 2024 අවසන් වර්ෂයේ ගිණුම්වලට ගලපන ලදී. අමාත්‍යාංශ නියෝජිතවරයා සමග අභ්‍යන්තරව පත්කරන ලද කණ්ඩායම මගින් පරිගණක සහ උපාංග ප්‍රත්‍යාගණන කණ්ඩායම සමන්විත විය..

3.1.1 ක්ෂයවීම්

දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ජීවකාලය පිළිබඳ තක්සේරුවකින් පසු සරල මාර්ග ක්‍රමයට ක්ෂය වීම් ගණනය කරනු ලැබේ.

ගොඩනැගිලි	වසර 40 යි
පිරියත හා යන්ත්‍රෝපකරණ	වසර 13.33 යි
මෝටර් හා වෙනත් වාහන	වසර 04 යි
කාර්යාලයීය උපකරණ හා ලී බඩු	වසර 10 යි
පරිගණක හා උපාංග	වසර 03 යි

3.2 තොගය

තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගය යන අගයන්ගෙන් අවම අගයට ගණනය කර ඇත.
සියලුම තොග අයිතමයන් මුලින් පිවිසි මුලින් නිකුත් ක්‍රමයට අනුව මෑන ඇත

3.2.1 වර්ෂ 2021 අධ්‍යාපන අමාත්‍යාංශය වැය ශීර්ෂය [126/1/2/18/2021 (22)] යටතේ රු. මිලියන 100ක වටිනාකමකින් යුතු ඔරියන්ට් වෙබ් ඔෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රය රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලබා දෙන ලදී.
මෙම වැය ශීර්ෂය යටතේම රුපියල් මිලියන 116.5ක වටිනාකමකින් යුතු ලොම්බාර්ඩි මුද්‍රණ යන්ත්‍රය වර්ෂ 2020 දී ලැබුණු අතර වර්ෂ 2021 දී ප්‍රාග්ධනීත කරන ලදී. රු. මිලියන 198ක වටිනාකමින් යුතු නව සිව්වර්ණවලින් සමන්විත (Sheet Fed) ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රය මෙම වර්ෂයේදී (2022) අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ සංස්ථාවට ලැබුණි.

3.3 බදුකරණය

3.3.1 ආදායම් බදු / විලම්බිත බදු

අදාළ වර්ෂයේ සහ පෙර වර්ෂවලට අදාළ ආදායම් බදු බැරකම් හෝ වත්කම් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට හෝ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.
ආදායම් බදු ගණනය කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර ඇති දිනට වලංගු බදු ප්‍රතිශතයන් සහ එදිනට නීතිරීතිවලට අනුව කටයුතු කරනු ලැබේ. ආදායම් බදු සඳහා වෙන් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල සඳහන්ව ඇති ආදායම් සහ වැය ප්‍රභවයන්ට අනුව 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට අනුව සහ ඉන් පසුව සිදුකරන ලද සංශෝධනවලට යටත්ව කටයුතු කරනු ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් 12 මත පදනම්ව විලම්බිත බදු ගැළපීම අවසන් ගිණුම් ප්‍රකාශයේ සිදු කර ඇත.

3.4 මුදල් හා මුදල්වලට සමාන දෑ

අත ඇති මුදල්, මාර්ගස්ථ මුදල් සහ බැංකුවේ ඇති මුදල්, මුදල් හා මුදල්වලට සමාන දෑ ලෙස සලකනු ලැබේ.
අරමුදල් ප්‍රධාන ප්‍රකාශනයේදී බැංකු අයිරාව සහ බැංකු ශේෂයට වැඩියෙන් ලබාගත් මුදල් ද මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස සලකනු ලැබේ.
මුදල් හා මුදල්වලට සමාන දෑ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සහ අනෙකුත් ගනුදෙනු සඳහා අධික ද්‍රවශීලතාවයක් ඇති ලෙස සැලකේ.

4. මූල්‍ය උපාංග - මූලික හඳුනාගැනීම් හා ඉදිරි පියවර

4.1 මූල්‍ය වත්කම්

4.1.1 වෙළඳ ණයගැතියෝ

වෙළඳ ණයගැතියන් සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්කර ඇත. බොල් ණය ගැතියන් සහ අඩමාන ණය ගැතියන් සඳහා වන ප්‍රතිපත්ති ප්‍රතිපාදන යටතේ සුගිය වසර දෙක තුළ සංස්ථාව විසින් දරන ලද බොල් ණය හා අඩමාණ ණය ප්‍රතිපාදන සලකා නොමැත.
සංස්ථාව විසින්ම වසර දහයකට වඩා පැරණි ශේෂයන් සඳහා 50% ප්‍රතිපාදනයක් වෙන් කරන අතර පැරණි ශේෂයන්හි අයකර ගැනීමේ හැකියාව විශ්ලේෂණය කිරීම මත තීරණය කර ඇත. වසර 2කට වැඩි සහ වසර 10කට අඩු ශේෂයන් සඳහා අයකර ගැනීමේ හැකියාව මත පදනම්ව 2% - 20%ක ප්‍රතිපාදනයක් වෙන් කිරීම සංස්ථාවේ ප්‍රතිපත්තියයි.

4.2 මූල්‍ය වගකීම්

4.2.1 දේපළ උකස් කිරීම

සියළු බැංකු පහසුකම් එනම් බැංකු අයිරාව, කෙටිකාලීන ණය, දිගුකාලීන ණය, ණයවර ලිපි හා කාර්ය සාධන බැංකු ඇපකර මත පදනම්ව මහජන බැංකුවේ ආයතනික බැංකු අංශය මගින් ලබාගෙන ඇත.
රාජ්‍ය භාණ්ඩාගාර ඇපකරයක් මගින් 2024. 09. 05 දින අංක TO/REV/TG/522 යටතේ ද පහත ව්‍යාපෘති සඳහන් කරමින් මහජන බැංකු ණය පහසුකම් ලබාගෙන ඇත.

ව්‍යාපෘතියේ නම	සුරක්ෂිත මුදල (රු.)	කල් ඉකුත්වන දිනය
බැංකු අයිරා, ණයවර ලිපි හා ඇපකර පහසුකම් සඳහා	මිලියන 1,165	2026. 09. 15

4.2.2 අසම්භාව්‍ය බැරකම් හා ප්‍රාග්ධන බැඳීම්

සියලුම ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය වගකීම සලකා බැලීම හා අත්‍යාවශ්‍ය ගැලපීම් කිරීම හෝ අනාවරණය කිරීම මූල්‍ය ප්‍රකාශ වල සිදු කර ඇත.

(අ) 248/19 මූලික අයිතිවාසිකම් නඩුව : හිටපු අලෙවි කළමනාකරු තිලක් පෙරේරා මහතා විසින් ඔහුගේ වැඩ තහනමට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි නඩුවක් පවරා ඇත. එම නඩුව ඉදිරියට පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදී ඇති අතර මීලඟ දිනයේ විවාදය සඳහා නියමිතයි.

(ආ) 33/1516 කම්කරු නඩුව : හිටපු අලෙවි කළමනාකරු තිලක් පෙරේරා මහතා විසින් ඔහුගේ සේවය අවසන් කිරීමට එරෙහිව හෝමාගම කම්කරු විනිශ්චය අධිකාරියේ මෙම නඩුව පවරා ඇති අතර දැනට නඩුව විභාග වෙමින් පවතී.

(ඇ) DMR 5233/19 :ගම්පහ අලෙවිසැලෙන් ණයට භාණ්ඩ ලබාගෙන මුදල් ලබා නොදීම හේතුවෙන් මෙම නඩුව අංජු පෙරේරා යන අයට විරුද්ධව පවරා ඇත. නඩුව ආරම්භ කරන අවස්ථාවේම ඔහු මියගිය බැවින් ඔහුගේ උරුමකරුවන් හඳුනාගන්නා තෙක් නඩුව බහා තබා ඇත.

(ඈ) එච්. එස්. පතිරාජ - ගම්පහ අලෙවිසැලෙහි සේවය කල කාර්යභාර නිලධාරී විසින් සිදුකර ඇති මුදල් වංචාව සම්බන්ධයෙන් සිදු කරන ලද පැමිණිල්ලට අදාලව ඔහුව අත්අඩංගුවට ගන්නා ලදී.

(ඉ) නඩු අංක 23340/M යටතේ ගම්පහ අලෙවිසැලේ කාර්යභාර නිලධාරී එච්. එස්. පතිරාජ යන අයට විරුද්ධව හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කිරීම නැවත කැඳවීම 2023. 03. 12

(ඊ) නඩු අංක HC/107/19 යටතේ ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් එස්. එම්. එල්. පී. විජේරත්න යන අයට විරුද්ධව ගම්පහ අධිකරණයේ නඩුවක් ගොනුකර ඇත.

(උ) නඩු අංක B/13370/18 යටතේ හිටපු සංසරාජ මාවත ස්ථානභාර නිලධාරී එච්. කේ. සිරිපාල යන අයට විරුද්ධව මාලිගාකන්ද අධිකරණයේ නඩුවක් ගොනු කර ඇත.

4.3.1 ප්‍රාග්ධනය

රු. මි. 15 ක මූලික ප්‍රාග්ධනය මහාභාණ්ඩාගාරය මගින් ර.මු.නී.ස හි ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යාමට සපයා දෙන ලදී.

4.3.2 ප්‍රත්‍යාගණන සංචිතය ඉඩම්

මෙම සංචිතයට 2023 දී කම්හල් සහ මෝටර් රථවාහන නැවත තක්සේරු කිරීමෙන් ලබාගත් අතිරික්තය සහ 2024 දී පරිගණක හා උපාංග ඇතුළත් වේ. 2024 PPE හි ඉතිරි කොටසෙන් ජනනය කරන ලද අතිරික්තය ඇතුලත් වන ආකාරය පහතින් දක්වා ඇත

	2016 (Rs.)	2017/18 (Rs.)	2023/2024(Rs.)	Total As at 01/12/2024 (Rs.)
මෝටර් හා වෙනත් වාහන	36,015,363		66,099,975	102,115,339
දේපළ		270,630,553	534,000,000	805,030,5533
ගොඩනැගිලි		158,049,568		158,049,568
පිරියත හා යන්ත්‍රෝපකරණ		246,979,194		246,979,194
කාර්යාලයීය උපකරණ සහ ලීබඩු		(8,785,874)		(8,785,874)
පරිගණක හා උපාංග		(1,537,152)	10,392,863	8,855,711
	36,015,363	**665,336,289**	**600,499,975**	**1,312,244,490**

5. විශ්‍රාම පාරිතෝෂිත වගකීම්

5.1 විශ්‍රාම පාරිතෝෂිකය

සංස්ථාව විසින් විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව සංස්ථාව වගකීමට බැඳේ.

වාර්තාකරනු ලබන දිනට ප්‍රතිලාභ අයදුම්පත්‍රයේ වාර්තාවන වටිනාකම ප්‍රක්ෂේපිත ඒකක ක්‍රමය අනුව මූල්‍ය ප්‍රකාශන තුල වගකීම ලෙස හඳුනාගෙන ඇත. හඳුනාගන්නා ලාභය හෝ පාඩුව වෙනත් ආදායම් තුල විස්තීරන ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනී.

5.2 සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ නීතිරීතිවලට අනුව සංස්ථාව (සේවායෝජක) විසින් සේවාදායකයා වෙත අදාළ අරමුදල් සඳහා බැර කිරීමට බැඳී සිටී. සංස්ථාව විසින් 12% ක් සහ 3%ක් සේවාදායකයාගේ දළ වැටුපට අනුව සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙළින් දායකත්වයක් ලබාදෙනු ලැබේ.

6. ආදායම් හා වියදම් ප්‍රකාශය

6.1 ආදායම් හඳුනාගැනීම

උපචිත පදනම මත සියලු ආදායම් හඳුනා ගැනේ.

පොලී ආදායම

සංස්ථා සේවකයින්ට ලබාදෙන ණය වලින් 5% ක පොලියක් අය කෙරේ. ස්ථාවර තැන්පතු වලින් ලැබෙන ආදායම නිසිපරිදි ගිණුම්වලට බැර වේ. ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම 2024 වර්ෂයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය අනුව කෙටි කාලීන පදනමින් සිදු කර ඇත.

6.2 වියදම් හඳුනාගැනීම

අයභාර වියදම්

සංස්ථාවේ පැවැත්මට හා දේපළ හා උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීමට දරන ලද සියළු වියදම් වර්ෂය තුළ ආදායමින් අඩුකර ඇත.

ප්‍රාග්ධන වියදම්

සංස්ථාවේ දේපළ හා උපකරණවල ඉපයීමේ ධාරිතාව වර්ධනය කරගැනීම හා ඉදිරියට ගෙනයාම සඳහා, දේපළ අත්පත් කරගැනීම සඳහා දිගු කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද සියළු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. සියලුම ප්‍රාග්ධන වියදම් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මත පදනම්ව සිදු වේ.

6.3 ණයට ගැනුම් පිරිවැය

ණයට ගැනුම් පිරිවැය ඒවා සිදුවූ කාලය තුළ වියදම් ලෙස හඳුනාගැනෙන අතර යන්ත්‍ර හා පිරියත ඒවා ක්‍රියාකාරිත්වයට පත්වන තෙක් දරණ ලද ඊට අදාළ පොලී වියදම ප්‍රාග්ධනගත කර ඇත.

7.0 අස්පාෂ්‍ය වත්කම්

සංස්ථාව 2024 වර්ෂයේ දී "Busy" නැමැති ගිණුම්කරණ හා මානව සම්පත් ස්වයංක්‍රීයකරණය සඳහා වන නිශ්චිත මෘදුකාංගයක් ලබා ගත්තේය. මූලික වශයෙන් 2024 වර්ෂයේදී එය ගිණුම්කරණ මොඩියුලයකින් හා මානව සම්පත් මොඩියුලයකින් සමන්විත වේ. මානව සම්පත් මොඩියුල සහ ගිණුම්කරණ මොඩියුලය 2025 වර්ෂයේදී සම්පූර්ණ කරනු ඇත.

එම නිසා මෘදුකාංග ප්‍රාග්ධනගත කිරීම ව්‍යාපෘතියේ සම්පූර්ණ අදියර සලකා බලා අර්ධ වශයෙන් සිදු කරන ලදී.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

	Note No.	2024 රු.	2023 රු.
08. ආදායම්			
ප්‍රධාන මුද්‍රණාලයෙන් ලද ආදායම			
පෙළ පොත්	24.1.1	1,802,375,086	7,470,886,455
ජොබ් වැඩ (වාණිජ මුද්‍රණ කටයුතු)	24.1.2	294,907,634	158,344,083
ජා.ලොෙ.ම. ලොතරැයිපත්	25.1	435,402,508	335,581,574
ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවෙන් ලද ආදායම	26.1	237,774,269	355,293,732
ප්‍රකාශන	27.1	890,841	1,341,378
වෙනත් අලෙවි කටයුතුවලින් ලද ආදායම	28.1	17,205,635	1,796,938
		2,788,555,974	**8,323,244,160**
09. විකුණුම් පිරිවැය			
ප්‍රධාන මුද්‍රණාලය	Note 24		
පරිභෝජනය කළ අමුද්‍රව්‍ය	2.1	940,308,642	3,574,439,856
සෘජු ශ්‍රමය	2.2	228,141,744	245,361,236
සෘජු කර්මාන්තශාලා වියදම්	2.3	65,758,569	78,301,919
වක්‍ර කර්මාන්තශාලා වියදම්	3	121,139,636	120,534,939
අනෙකුත් වියදම් / තොග ගැලපීම්	5	39,708,973	63,254,647
		1,395,057,564	**4,081,892,597**
සුරක්ෂා මුද්‍රණ අංශය	Note 25		
පරිභෝජනය කළ ද්‍රව්‍ය	2.1	235,535,023	226,383,244
සෘජු ශ්‍රමය	2.2	54,354,985	43,589,848
සෘජු කර්මාන්තශාලා වියදම්	2.3	23,401,904	30,208,576
වක්‍ර කර්මාන්තශාලා වියදම්	3	43,268,128	37,444,001
		356,560,041	**337,625,669**
ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාව	Note 26		
පරිභෝජනය කළ ද්‍රව්‍ය	2.1	241,176,707	525,336,845
සෘජු ශ්‍රමය	2.2	53,362,021	42,775,566
සෘජු කර්මාන්තශාලා වියදම්	2.3	11,949,067	7,803,182
වක්‍ර කර්මාන්තශාලා වියදම්	3	13,024,957	12,705,929
අනෙකුත් වියදම් / තොග ගැලපීම්	5	2,294,955	(108,837,261)
		321,807,706	**479,784,261**
ප්‍රකාශන අංශයේ පිරිවැය	Note - 27.3	2,954,521	2,714,813
අනෙකුත් අලෙවි අංශවල පිරිවැය	Note - 28.2	12,560,923	891,531
මුළු විකුණුම් පිරිවැය		**2,088,940,756**	**4,902,908,871**
10. වෙනත් මෙහෙයුම්වලින් ලද ආදායම			
මුද්‍රණාලීය අබලි කොල සහ අනෙකුත් ද්‍රව්‍ය		47,855,469	81,166,072
ටෙන්ඩර් කැන්පතු සහ ලියාපදිංචි		735,300	894,500
ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ ආනයනික අමුද්‍රව්‍ය ආදායම			12,433,095
		48,590,769	**94,493,667**

	2024 රු.	2023 රු.
11. විකිණීමේ හා බෙදාහැරීම් වියදම්		
වැටුප් හා වේතන - අලෙවි හා විකුණුම්	22,285,642	18,248,320
අතිකාල දීමනා - අලෙවි හා විකුණුම්	702,676	1,048,397
සේවක අර්ථසාධක අරමුදල - අලෙවි හා විකුණුම්	2,738,697	2,155,355
සේවක භාරකාර අරමුදල - අලෙවි හා විකුණුම්	684,674	781,333
විශේෂ දිරි දීමනා - අලෙවි හා විකුණුම්	259,250	190,000
ආහාර දීමනා/සේවක සුභසාධනය	1,280,790	905,023
සේවක වෛද්‍ය පහසුකම්	1,436,841	620,360
ප්‍රවාහන දීමනා		-
සේවක නිවාස ණය පොලී	40,007	13,496
කුලී - අලෙවිසැල්	1,925,830	1,941,144
වරිපනම්	71,389	70,692
ජල ගාස්තු - අලෙවිසැල්	43,525	39,373
විදුලිය - අලෙවිසැල්	165,752	192,365
දුරකථන - අලෙවිසැල්	87,296	201,863
මෝටර් රථවාහන නඩත්තුව	6,701,538	3,665,001
බොල් ණය සඳහා ප්‍රතිපාදන	4,662,324	4,579,788
බොල් ණය		702,671
දැන්වීම් සඳහා	638,120	255,000
අලෙවි ප්‍රවර්ධන කටයුතු	703,640	1,083,505
අලෙවිසැල් නඩත්තුව	81,750	
වැටයීම් ගණනය කිරීම	207	
අලෙවිසැල් රක්ෂණය	27,590	128,137
නිමි බඩු ප්‍රවාහනය	128,756	800,140
එකතුව	**44,584,545**	**37,703,712**

		2024 රු.	2023 රු.
12.	**ආයතන හා පරිපාලන වියදම්**		
	ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු	3,186,077	3,351,588
	කාර්යාල උපකරණ නඩත්තුව	1,362,212	2,810,263
	ක්ෂයවීම් - කාර්යාලයීය උපකරණ	2,357,859	1,943,178
	- පරිගණක උපාංග	6,397,454	2,461,510
	වැටුප් හා වේතන	99,932,871	84,295,157
	අතිකාල දීමනා	14,929,932	16,971,708
	සේවක අර්ථසාධක අරමුදල	12,255,820	10,652,231
	සේවක භාරකාර අරමුදල	3,063,955	2,662,906
	දිරි දීමනා	1,092,159	958,500
	ආහාර දීමනා/සේවක සුභසාධනය	10,364,039	12,253,624
	ප්‍රවාහන දීමනා	7,904,502	4,270,070
	සේවක වෛද්‍ය පහසුකම්	6,189,508	2,094,755
	සේවක නිවාස ණය පොලී	1,066,461	178,389
	සභාපති වේතනය	1,037,000	1,099,413
	අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු	722,000	524,000
	තැපැල් ගාස්තු	387,624	376,956
	දුරකථන	1,452,820	1,171,470
	මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	1,661,135	3,113,612
	පුවත්පත් දැන්වීම් හා ප්‍රකාශන	2,145,065	1,580,188
	ප්‍රවාහනය හා යැපුම් දීමනා	468,624	959,448
	පුවත්පත් හා වාර සඟරා	176,120	166,530
	පොදු කාර්යාලයීය වියදම්	1,566,204	168,495
	විගණන වියදම්	1,048,800	1,048,800
	විවිධ වියදම්	1,023,722	377,664
	නෛතික හා උපදේශන සේවා	627,814	475,713
	චින්දනාත්මක කටයුතු	763,737	263,620
	පාරිතෝෂික වියදම්	90,967,985	58,518,274
	සේවක පුහුණු කිරීම්	893,188	510,010
	විගණන හා කළමනාකරණ කමිටු ගාස්තු	155,500	203,372
	අන්තර්ජාල / විද්‍යුත් තැපෑල	536,210	438,932
	ටෙන්ඩර් මණ්ඩල තාක්ෂණික කමිටු වියදම්	452,000	371,500
	20ක් මෝටර් රථවාහන නඩත්තුව	6,701,538	3,665,001
	අධ්‍යක්ෂ මණ්ඩල හමු සඳහා වියදම්	165,539	106,918
	සාමාජික ගාස්තු	10,649	30,000
	පරිත්‍යාග	449,830	187,775
	පරිගණක අලුත්වැඩියා හා නඩත්තු ගාස්තු	127,219	63,935
	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු		1,918,370
	වගා ව්‍යාපෘති වියදම්	243,387	98,714
		283,886,561	**222,342,589**
13.	**වෙනත් මෙහෙයුම් වියදම්**		
	කාර්ය මණ්ඩල ප්‍රවාහනය	5,813,618	7,699,118
	උත්සව අත්තිකාරම්	11,950,000	
	විශේෂ දිරි දීමනා	43,651,293	52,572,803
	නිවාඩු සඳහා ගෙවීම්	15,201,495	13,938,664
	කාර්ය මණ්ඩල සම්මාන	97,500	-
		76,713,906	**74,210,585**
14.	**මූල්‍ය ආදායම්**		
	ආපදා ණය සඳහා පොලී ලැබීම්	1,358,603	194,492
	බැංකු පොලී ලැබීම් - ඉතිරි කිරීම් ගිණුම පොලී	316,708	14,640,405
	ස්ථිර තැන්පතු සඳහා පොලී ලැබීම්	8,999,079	-
		10,674,390	**14,834,896**

	2024 රු.	2023 රු.
14.1 මූල්‍ය වියදම් හා වෙනත් වියදම්		
බැංකු ගාස්තු හා බැංකු ඇපකර ගාස්තු	4,337,331	5,350,022
බැංකු අයිරා පොලී	7,126,780	
බැංකු ණය පොලී - කෙටි කාලීන	35,307,062	210,877,086
බැංකු ණය පොලී - දිගු කාලීන	3,248,104	
දඩ මුදල් ගාස්තු	264,336	187,680
ගෙවිය යුතු පොලී ස්ථාවර තැන්පතු	2,868,100	
	39,908,729	**229,657,771**

15. ආදායම් බදු

2023 දෙසැම්බර් 31න් අවසන්වන වර්ෂය සඳහා ගිණුම් මත පදනම්ව 2023/24 වර්ෂ සඳහා ප්‍රකාශිත ආදායම් බදු ගණනය සිදුකර ඇත.

බදු හඳුනා ගැනීමේ අංකය : 409000126 - 0000

	සටහන	Rs.
වෙළෙඳ ලාභය	A	375,273,176
පොලී ආදායම		10,674,390
වෙනත් මූලාශ්‍රවලින් ලද ආදායම		-
ව්‍යවස්ථාපිත ආදායම		**385,947,566**
(-) අඩුකළා: මුළු විවිස්ථිත ආදායමෙන් අඩුකිරීම		
අඩුකළ හැකි අලාභ	B	-
බදු අයකළ හැකි ආදායම්		**385,947,566**
බදු		
ආදායම් බදු	@ 30%	115,784,270
ගෙවිය යුතු මුළු ආදායම් බද්ද		**115,784,270**

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

ආදායම් බදු ගණනය කිරීමේ සටහන් - 2024

සටහන A

	සටහන් අංකය		රු.
ව්‍යාපාරයෙන් ලද ආදායම			
ගිණුම් අනුව ශුද්ධ ලාභය			284,371,453
අඩුකළා:			
ව්‍යාපාර නොවන කටයුතු වලින් ලද ලාභය			
ආයෝජන ආදායම		10,674,390	
වෙනත් මූලාශ්‍ර වලින් ලද ලාභය			
ස්ථාවර වත්කම් විකිණීමේ ලාභය		-	(10,674,390)
			273,697,063
එකතු කළා:			
ඉඩ නොදෙන වියදම්			
ක්ෂයවීම්	01	105,439,186	
පුරස්කාර		89,209	
විනෝදාත්මක ණය		763,737	
ආධාර		449,830	
නීතිමය වියදම්		627,814	
බොල්ණය සඳහා වෙන් කිරීම්		4,662,324	
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		90,967,985	
විගණන ගාස්තු වෙන් කිරීම්		1,048,800	
දඩ මුදල්		264,336	
ප්‍රමාද ගාස්තු සහ ප්‍රමාණ අඩුකිරීම් සඳහා අඩුකිරීම්		1,439,410	
ප්‍රචාරණ	02	319,060	206,071,692
			479,768,754
අඩුකළා:			
ප්‍රාග්ධන දීමනාව	03	83,114,006	
වර්ෂය තුළ පාරිතෝෂික ගෙවීම්	04	20,332,773	
විගණන ගාස්තු ගෙවීම්		1,048,800	(104,495,579)
ව්‍යාපාර කටයුතු වලින් ලද ලාභය			**375,273,176**

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

16. දේපළ, පිරියත සහ උපකරණ

විස්තරය	පිරිවැය/ ප්‍රත්‍යාගණනය 01. 01. 2023	ප්‍රත්‍යාගණන/ පිරිවැය 31. 12. 2023	ප්‍රත්‍යාගණන/ වර්ෂය තුළ එකතු කිරීම්	2023 වර්ෂය තුළ ඉවත් කිරීම්	පිරිවැය/ ප්‍රත්‍යාගණනය 31. 12. 2023	2024 වර්ෂය තුළ එකතු කිරීම්	ප්‍රත්‍යාගණන/ පිරිවැය 2024	2024 වර්ෂය තුළ ඉවත් කිරීම්	2024. 12. 31 දිනට ශේෂය
පිරිවැයට									
ඉඩම්	271,500,000	805,900,000			805,900,000				805,900,000
ගොඩනැගිලි	166,600,000			-	166,600,000	393,000		-	166,993,000
ඉදිකිරීම් නොනිමි					-	5,039,101			5,039,101
පිරියත හා යන්ත්‍රෝපකරණ	1,002,802,440		9,450,143	-	1,012,252,583	1,606,826		-	1,013,859,409
මෝටර්රථ හා මෝටර් සයිකල්	55,563,000	66,100,000		-	66,100,000			-	66,100,000
කාර්යාලයීය උපකරණ	21,282,520		2,526,996	-	23,809,516	3,604,621		-	27,414,137
පරිගණක හා උපාංග	13,280,225		12,921,829	-	26,202,054	4,120,800	22,942,471	-	19,345,531
අස්පෘෂ්‍ය වත්කම්			-	-				-	3,596,940
ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන	2,572,951			-	2,572,951			-	2,572,951
එකතුව	**1,533,601,136**	**872,000,000**	**24,898,969**	**-**	**2,103,437,105**	**14,764,348**		**-**	**2,110,821,070**
සමුච්චිත ක්ෂය වීම්									
විස්තරය	**ප්‍රත්‍යාගණනය 01. 01. 2023**		**වර්ෂය තුළ ඉවත් කිරීම්**	**සමුච්චිත ක්ෂයවීම් 31.12.2023**	**වර්ෂය තුළ ඉවත් කිරීම්**	**පිරිවැය / ප්‍රත්‍යාගණනය 01.01.2024**		**වර්ෂය තුළ ක්ෂයවීම් 2024**	**සමුච්චිත ක්ෂයවීම් 31.12.2024**
ගොඩනැගිලි	24,990,000		4,165,000	-	29,155,000	4,165,000		-	33,320,000
පිරියත හා යන්ත්‍රෝපකරණ	260,965,606		75,606,183	-	336,571,789	75,993,873		-	412,565,663
මෝටර් රථ හා මෝටර් සයිකල්	55,562,976	(55,562,975.50)	-	-	-	16,525,000		-	16,525,000
කාර්යාලයීය උපකරණ හා ලී බඩු	7,783,107		1,943,178	-	9,726,285	2,357,859		-	12,084,144
පරිගණක හා උපාංග	8,914,283		2,461,510	-	11,375,792	6,397,454	(17,773,246)	-	0
ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන	2,572,950		-	-	2,572,950			-	2,572,950
එකතුව	**360,788,921**	**816,437,025**	**84,175,871**	**-**	**389,401,817**	**105,439,186**		**-**	**477,067,757**
ලියා හල අගය					**1,714,035,288**				**1,633,753,313**

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයට අදාළ සටහන්

	2024 රු.	2023 රු.
17. තොගය		
අමුද්‍රව්‍ය	1,088,672,145	1,003,872,106
පාරිභෝගික භාණ්ඩ	10,182,369	9,245,305
අමතර කොටස්	70,477,125	60,419,712
ලෝහ භාණ්ඩ / ගොඩනැගිලි ද්‍රව්‍ය	1,127,975	1,296,296
නිමි තොගය	101,385,396	89,648,384
නොනිමි තොගය	77,537,055	86,553,547
මාර්ගස්ථ තොග	12,021,912	8,392,206
එකතුව	**1,361,403,978**	**1,259,427,556**
18. වෙළඳ ලැබිය යුතු ශේෂය		
වෙළඳ ණයගැතියෝ	618,417,892	1,008,219,259
බොල් ණය සඳහා වෙන් කිරීම්	(78,848,951)	(74,186,627)
වෙනත් ණයගැතියෝ	2,486,280	
එකතුව	**539,568,941**	**936,518,912**
19. වෙනත් ලැබිය යුතු ශේෂය		
සේවක ණය හා අත්තිකාරම් (සටහන 19.1)	55,243,451	20,165,837
තැන්පතු හා ලැබීම් (සටහන 19.2)	25,177,501	6,911,996
විකුණුම් පාලන ගිණුම (සටහන 19.3)	175,082	175,082
	80,596,035	**27,252,915**
19.1 ණය හා අත්තිකාරම්		
ආපදා ණය	53,447,312	15,850,691
උත්සව අත්තිකාරම්	1,436,000	1,563,000
සේවක වැටුප් අත්තිකාරම්	-	
ණය හිමි අත්තිකාරම් ගිණුම	360,140	2,752,146
එකතුව	**55,243,451**	**20,165,837**
19.2 තැන්පතු හා ලැබීම්		
තැන්පතු සඳහා ලැබීම්	25,021,347	6,759,487
අමතර වෙනත් ලැබීම්	156,154	152,509
එකතුව	**25,177,501**	**6,911,996**
19.3 විකුණුම් පාලන ගිණුම		
විකුණුම් පාලන ගිණුම	175,082	175,082
එකතුව	**175,082**	**175,082**
20. මුදල් හා මුදල්වලට සමාන දෑ		
බැංකුවේ ඇති මුදල්	113,702,755	112,541,648
මාර්ගස්ථ මුදල්	5,278,811	
අතැති මුදල්	3,770,504	24,000
	117,473,259	**117,844,459**

	2024 රු.	2023 රු.
21. වෙළඳ ගෙවිය යුතු ශේෂයන්		
වෙළඳ ණය හිමියන්	56,262,016	103,841,901
ඉන්දියන් ණය යෝජනා ක්‍රමය - ණය මුදල	-	
වෙනත් ණය හිමියන් පුරස්කර, නියෝජනය, වෙනත්	2,491,327	1,909,382
වෙනත් ණය හිමියන් (හර ශේෂය)	1,866,580	1,279,659
එකතුව	**60,619,922**	**107,030,942**
22. වෙනත් ගෙවිය යුතු ශේෂයන්	88,159,281	56,846,704
උපචිත වියදම්	5,522,143	3,143,233
තැන්පතු ගෙවීම්	15,014,526	
ඉතිරිකර ගත් නිවාඩු වෙනුවෙන් වෙන් කිරීම්	3,465,000	5,400,000
ලිපිද්‍රව්‍ය කාර්යමණ්ඩලය සඳහා ප්‍රතිපාදන	**112,160,950**	**65,389,937**
23 ගෙවිය යුතු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ආර්ථික සේවා ගාස්තු	23,342,409	23,342,409
එකතු කළ අගය මත බදු	255,942,678	77,720,630
ජාතික ආරක්ෂක බදු	80,840,239	80,840,239
ආදායම් බදු	4,503,051	5,000,000
රඳවා ගැනීමේ බදු	-	
රඳවා ගැනීමේ බදු - 10% ගෙවිය යුතු	126,300	126,300
ගෙවිය යුතු සමාජ ආරක්ෂණ බදු	27,513,224	152,827,591
	392,267,901	**339,857,169**

කාරක ගිණුම (ප්‍රධාන මුද්‍රණාලය) 2024. 01. 01. සිට 2024. 12. 31 දක්වා කාලසීමාව තුළ

			2024.12.31 දක්වා රු.	2023.12.31 දක්වා රු.
24.	(1)	මුද්‍රණ ආදායම		
	(1.1)	පෙළපොත්	1,802,375,086	7,470,886,455
	(1.2)	ජොබ් වැඩ (වාණිජ මුද්‍රණ කටයුතු)	294,907,635	158,344,083
	(1.3)	ලිපිද්‍රව්‍ය කම්හල සඳහා ආදායම් මාරුකිරීම	(59,235,580)	
	(1)	මුළු ආදායම්	**2,038,047,141**	**7,629,230,538**
		ආදායම් අඩු කළ ගාස්තු		
	(1.1.1)	ප්‍රමාද ගෙවීම්/තත්ව හානි හා දඩ (අ.ප්‍ර.දෙ.)	1,410,697	22,079,618
	(1.1.2)	අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු/තත්ව හානි සඳහා වෙන්කිරීම්	-	-
	(1.1.3)	ජොබ් වැඩ සඳහා වන අඩු කිරීම්		2,245
	(1.4)	මුළු ආදායමෙන් අඩු කළ ගාස්තු	1,410,697	22,081,863
	(1.5)	ලැබිය යුතු මුළු ආදායම (1 - 1.4)	**2,036,636,443**	**7,607,148,675**
	(2)	කර්මාන්තශාලා වියදම් (සෘජු)		
	(2.1)	අමු ද්‍රව්‍ය පරිභෝජනය	940,308,642	3,574,439,85
		ශ්‍රමය - සෘජු		
		වැටුප් හා වේතන	131,709,026	111,224,677
		අතිකාල දීමනා	23,669,704	29,992,405
		කෑලි ගණනට වැඩ කිරීම්	31,519,609	73,946,324
		සේවක අර්ථසාධක අරමුදල	16,776,826	14,427,085
		සේවක භාරකාර අරමුදල	4,194,207	3,606,774
		දිරි දීමනා	1,512,750	1,349,750
		ආහාර දීමනා / සේවක සුභසාධනය	8,459,550	6,562,680
		සේවක වෛද්‍යාධාර ක්‍රමය	9,788,913	3,584,634
		සේවක නිවාස ණය පොලී	511,160	666,906
	(2.2)	මුළු සෘජු ශ්‍රමය	228,141,744	245,361,236
		වෙනත් කර්මාන්තශාලා වියදම - සෘජු		
		පරිභෝජන ද්‍රව්‍ය පරිභෝජනය	18,035,558	26,100,659
		අමතර කොටස් පරිභෝජනය	20,833,852	16,721,310
		ද්‍රව්‍ය පරිභෝජනය	3,678,767	3,411,589
		විදුලිය සෘජු	23,210,393	32,068,361
	(2.3)	සෘජු වෙනත් කර්මාන්ත ශාලා වියදම්	65,758,569	78,301,919
	(2)	සෘජු වියදම් [2.1 + 2.2 + 2.3]	**1,234,208,955**	**3,898,103,011**
	(3)	කර්මාන්තශාලා වියදම් (වක්‍ර)		
		වැටුප් හා වේතන	22,741,045	21,045,039
		අතිකාල දීමනා	10,007,991	13,798,614
		සේවක අර්ථසාධක අරමුදල	2,756,911	2,538,351
		සේවක භාරකාර අරමුදල	689,228	634,588
		දිරි දීමනා	246,379	224,000
		ආහාර දීමනා / සේවක සුභසාධනය	1,404,030	2,446,687
		යන්ත්‍රෝපකරණ හා නඩත්තු	13,620,892	22,394,436
		බාහිර මුද්‍රණ වැඩ	8,917,241	2,376,456
		බාකෝර්ඩින් පද්ධතිය නඩත්තුව හා නවීකරණය කිරීම	-	-
		විදුලිය	2,578,933	3,563,151
		සේවක රක්ෂණය	399,879	229,229

		2024.12.31 දක්වා රු.	2023.12.31 දක්වා රු.
	නිමි බඩු ප්‍රවාහනය	1,808,158	
	ගිනි රක්ෂණය	2,008,545	1,200,097
	සාම්පල හා කඩදාසි පරීක්ෂා කිරීමේ ගාස්තු	54,830	13,160
	යන්ත්‍ර කුලියට ගැනීමේ වියදම්	-	
	නැවත නොගෙවන ප්‍රසම්පාදන තැන්පතු	568,650	158,430
	රථ වාහන නඩත්තු		
	අලුත්වැඩියාවන්	7,663,825	9,464,960
	ඉන්ධන සහ තෙල්	8,359,935	7,982,662
	රක්ෂණය	958,926	877,383
	ක්ෂය	16,525,000	0
	අඩු කළා :-		
	20% ක් ලාභාලාභ ගිණුමේ පරිපාලන වියදම්	6,701,537)	(3,665,001)
	20% ක් විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්	(6,701,537)	(3,665,001)
	20% ක් ලිපිද්‍රව්‍ය කම්හලේ කාරක ගිණුම සඳහා	(6,701,537)	(3,665,001)
	20% ක් සුරක්ෂා මුද්‍රණ කාරක ගිණුම සඳහා	(6,701,537)	(3,665,001)
	ක්ෂය කිරීම		
	ගොඩනැගිලි	2,505,000	2,505,000
	යන්ත්‍රෝපකරණ	44,130,388	43,742,700
(3)	**මුළු වක්‍ර පිරිවැය**	**121,139,636**	**120,534,939**
(4)	**නිෂ්පාදන පිරිවැය** - තොග රහිත [2 + 3]	**1,355,348,591**	**4,018,637,950**
	එකතු කළා : ආරම්භක තොගය නොනිමි වැඩ තොගය	45,370,890	19,842,090
	ආරම්භක තොගය නිමි භාණ්ඩ තොගය		-
	අඩු කළා : අවසාන තොගය නොනිමි වැඩ තොගය	(41,381,780)	(45,370,890)
	අවසාන තොගය නිමි භාණ්ඩ තොගය	-	-
	අඩු කළා : පරිගණක ලිපිද්‍රව්‍ය අංශයට හුවමාරු කළ අගය	(1,588,581)	(3,072,265)
	හානි වූ තොගය		5,453,414
	හිඟ තොගය - අමතර කොටස්	10,227,088	15,981,605
	හිඟ තොගය - දෘඩාංග	1,137,182	1,588,321
	අතිරික්ත තොගය - අමතර කොටස්	(2,253,366)	(1,976,017)
	අතිරික්ත තොගය - දෘඩාංග	(88,105)	(1,250)
	බදු එකතුකළ නොහැකි ආදායම	39,708,973	63,254,647
(5)	තොග ගැලපීම්	**63,254,647**	**32,249,981**
(6)	මුළු නිෂ්පාදන වියදම	**1,395,057,564**	**4,081,892,597**
(7)	සමාජ ආරක්ෂණ බද්ද	44,567,267	162,121,149
(8)	දළ ලාභය [1.2 - 6 - 7]	**597,011,612**	**3,363,134,929**

නිෂ්පාදන ගිණුම (සුරක්ෂා මුද්‍රණ) 2024. 01. 01. සිට 2024. 12. 31 දක්වා කාලසීමාව තුළ

		2024.12.31 දක්වා රු.	2023.12.31 දක්වා රු.
25.	මුද්‍රණ ආදායම		
(1)	ලොතරැයි මුද්‍රණය (ජා.ලොෙ.ම.)	435,402,508	335,581,574
(1.1)	මුද්‍රණ දෝෂ සඳහා අය කිරීම සඳහ ජා.ලොෙ.ම. අඩු කිරීම	28,712	5,618,280
(1.2)	**ලැබිය යුතු මුළු ආදායම (1 - 1.1)**	**435,373,796**	**329,963,294**
(2)	කර්මාන්තශාලා වියදම් (සෘජු)		
(2.1)	අමු ද්‍රව්‍ය පරිභෝජනය	**235,535,023**	**226,383,244**
(2.2)	ශ්‍රමය - සෘජු		
	වැටුප් හා වේතන	27,749,858	31,544,326
	අතිකාල දීමනා	4,072,249	5,149,072
	සේවක අර්ථසාධක අරමුදල	3,482,628	3,367,305
	සේවක භාරකාර අරමුදල	870,657	841,827
	දිරි දීමනා	271,500	260,500
	ආහාර දීමනා / සේවක සුභසාධනය	2,170,350	1,626,923
	කෑලි ගණනට ගෙවීම	13,900,042	
	සේවක වෛද්‍යාධාර ක්‍රමය	1,801,791	768,100
	සේවක නිවාස ණය පොළී	35,909	31,796
(2.2)	**මුළු සෘජු ශ්‍රමය**	**54,354,985**	**43,589,848**
(2.3)	වෙනත් කර්මාන්තශාලා වියදම - සෘජු		
	පරිභෝජන ද්‍රව්‍ය පරිභෝජනය	6,595,683	6,543,094
	අමතර කොටස් පරිභෝජනය	11,335,473	16,524,671
	ද්‍රව්‍ය පරිභෝජනය (20%)	919,691	852,897
	විදුලිය සෘජු (15%)	4,551,057	6,287,914
(2.3)	**(4) සෘජු වෙනත් කර්මාන්ත ශාලා වියදම්**	**23,401,904**	**30,208,576**
(2)	**එකතුව සෘජු වියදම් [2.+2.2+2.3]**	**313,291,913**	**300,181,668**
(3)	කර්මාන්තශාලා වියදම් (වක්‍ර)		
	වැටුප් හා වේතන	4,161,990	3,124,970
	අතිකාල දීමනා	404,873	144,367
	සේවක අර්ථසාධක අරමුදල	543,101	363,341
	සේවක භාරකාර අරමුදල	135,775	90,835
	දිරි දීමනා	23,000	19,500
	සේවක සුභසාධනය	77,940	
	ප්‍රවාහන දීමනා	70,000	412,500
	වක්‍ර ශ්‍රමය සඳහා මුළු වියදම	5,416,680	4,155,513
	බාහිර ආයතන වල වැඩ	4,478,886	2,656,599
	ආපසු නොගෙවන ටෙන්ඩර් කැන්පතු	-	-
	නිම්බඩු ප්‍රවාහනය	19,000	
	යන්ත්‍රෝපකරණ නඩත්තුව	-	-
	20% වාහන නඩත්තුව	6,701,537	3,665,001
	බාර්කෝඩින් නඩත්තුව සහ නවීකරණය	-	-
	රක්ෂණය - ජා.ලොෙ.ම. මුද්‍රණ	61,229	376,092
	ක්ෂය		
	ගොඩනැගිලි (1/3 ප්‍රධාන මුද්‍රණාලය)	1,252,500	1,252,500
	යන්ත්‍ර / උපකරණ	25,338,297	25,338,296
(3)	**මුළු වක්‍ර වියදම්**	**43,268,128**	**37,444,001**
(4)	**නිෂ්පාදන වියදම් [2 + 3]**	**356,560,041**	**337,625,669**
(5)	**සමාජ ආරක්ෂණ බද්ද**	9,252,303	7,131,108
(6)	**දල ලාභය [1.1 - 4 - 5]**	**69,561,452**	**(14,793,483)**

			2024.12.31 දක්වා රු.	2023.12.31 දක්වා රු.
26.	(1)	ලිපිද්‍රව්‍ය විකිණීමෙන් ආදායම	237,774,269	355,293,732
		ප්‍රධාන මුද්‍රණාලයෙන් ආදායම් මාරු කිරීම්	59,235,580	
		මුළු ආදායම	297,009,850	355,293,732
	(2.1)	මුළු අමුද්‍රව්‍ය පරිභෝජනය	241,176,707	525,336,845
	(2.2)	ශ්‍රමය - සෘජු :		
		සේවක වැටුප් හා වේතන	31,764,893	24,760,966
		අතිකාල දීමනා	11,158,980	10,977,625
		සේවක අර්ථසාධක අරමුදල	4,066,114	3,270,444
		සේවක භාරකාර අරමුදල	1,013,918	817,611
		දිරි දීමනා	321,250	291,750
		කැලි ගණනට ගෙවීම	443,068	
		ආහාර දීමනා / සේවක සුභසාධනය	2,282,850	1,873,190
		සේවක වෛද්‍යාධාර දීමනා	2,255,080	709,700
		සේවක නිවාස ණය පොලී	55,867	74,280
		ප්‍රවාහන දීමනා	-	
	(3)	මුළු සෘජු ශ්‍රමය	**53,362,021**	**42,775,566**
	(2.3)	කර්මාන්ත ශාලා වියදම් - සෘජු		
		පරිභෝජන ද්‍රව්‍ය පරිභෝජනය	1,641,362	3,314,560
		ද්‍රව්‍ය පරිභෝජනය	7,831,994	1,555,937
		විදුලිය	2,475,711	2,932,684
	(2.3)	**මුළු සෘජු කර්මාන්තශාලා වියදම්**	**11,949,067**	**7,803,182**
	(2)	**මුළු සෘජු වියදම් [2 .1+2.2+2.3]**	**306,487,794**	**575,915,592**
	(3)	**කර්මාන්තශාලා වියදම් - වක්‍ර**		
		වැටුප් හා වේතන	3,845,498	3,229,786
		අතිකාල දීමනා	900,214	774,723
		සේවක අර්ථසාධක අරමුදල	567,598	470,360
		සේවක භාරකාර අරමුදල	144,511	117,590
		දිරි දීමනා	50,250	36,250
		සංඛ්‍යා කේත නඩත්තු	150,000	
		ආහාර දීමනා /සේවක සුභසාධනය	159,120	
		විදුලිය	275,079	325,854
		ක්ෂය කිරීම		
		ගොඩනැගිලි	407,500	407,500
		යන්ත්‍රෝපකරණ	6,525,188	6,525,188
	(3)	කර්මාන්ත ශාලා වියදම් වක්‍ර	13,024,957	12,705,929
	(4)	නිෂ්පාදන පිරිවැය - තොග රහිත [5 + 6]	**319,512,751**	**588,621,521**
		එකතු කළා : ආරම්භක තොගය		
		නොනිමි වැඩ	41,182,657	2,182,479
		නිමි භාණ්ඩ	80,741,211	6,406,194
		අඩු කළා : අවසාන තොගය නොනිමි වැඩ	(36,155,275)	(41,182,657)
		නිමි භාණ්ඩ	(84,399,364)	(80,741,211)
		හානි වූ තොග - වරකාපොල ගම්පහ	(99,520)	-
		අඩු කළා ; **ලිපිද්‍රව්‍ය මාරුකළා සේවක සුභසාධන, පරිත්‍යාග හා වෙනත්**	(6,772,380)	(2,489,116)
		මෝටර් රථ වර්ක්ෂාකම ප්‍රධාන මුද්‍රණාල කාරක ගිණුමෙන් මාරුකළා 25%	6,701,538	3,665,001
		හිඟ තොගය - අමුද්‍රව්‍ය	36,800	-
		හිඟ තොගය - පරිභෝජන ද්‍රව්‍ය	3,000	214,429
		හිඟ තොගය - අමතර කොටස්	1,833,512	3,076,222
		අතිරික්ත තොගය - අමතර කොටස්	(628,518)	(1,022)
		අතිරික්ත තොගය - පරිභෝජන ද්‍රව්‍ය	(111,907)	(4,380)
		හානි වූ තොග - වරකාපොල - අලාභය	-	
	(5)	ආරම්භක/අවසාන තොග ගැලපීම්	2,294,955	(108,837,261)
	(6)	එකතුව නිෂ්පාදන පිරිවැය (4 + 5)	321,807,706	479,784,260
	(7)	**සමාජ ආරක්ෂණ බද්ද**	5,047,758	7,549,992
	(8)	දළ කාරක ලාභය [1 - 6 - 7]	(29,845,615)	(132,040,520)

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

ආදායම් සහ වියදම් ගිණුම (ප්‍රකාශන අංශය) 2024. 01. 01. සිට 2024. 12. 31 දක්වා කාලසීමාව තුළ

			2024.12.31 දක්වා රු.	2023.12.31 දක්වා රු.
27.	(1)	ආදායම්	**890,841**	**1,341,378**
		අඩු කළා : නිෂ්පාදන පිරිවැය :		
		ආරම්භක තොගය	2,156,972	2,849,885
		අඩු කළා : අවසාන තොගය	(1,120,548)	(2,156,972)
		නිෂ්පාදන පිරිවැය	**1,036,424**	**692,913**
		මාරු කළා, සේවක සුභසාධන, පරිත්‍යාග සහ වෙනත්		
	(2)	එකතු කළා : වියදම්		
		වැටුප් හා වේතන	1,335,536	1,363,851
		අතිකාල දීමනා	86,396	157,405
		සේවක අර්ථසාධක අරමුදල	167,122	175,602
		සේවක භාරකාර අරමුදල	41,781	43,901
		දිරි දීමනා	16,750	14,500
		ආහාර දීමනා / සේවක සුභසාධනය	84,420	70,815
		සේවක වෛද්‍යාධාර දීමනා	96,883	61,688
		ප්‍රවාහන දීමනා	-	
		කර්තෘ භාග	89,209	134,138
		ප්‍රකාශන පරිත්‍යාග	-	
		මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය (ප්‍රකාශන)	-	(
	(3)	මුළු නිෂ්පාදන වියදම්	2,954,521	2,714,813
		(-) සමාජ ආරක්ෂණ බද්ද	11,936	16,767
	(4)	ආදායමට වඩා වැඩි වී ඇති වියදම	**(2,075,616)**	**(1,390,202)**

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

වෙළඳ ගිණුම (වෙනත් අලෙවි අංශ) 2024. 01. 01. සිට 2024. 12. 31 දක්වා කාලසීමාව තුළ

			2024.12.31 දක්වා රු.	2023.12.31 දක්වා රු.
28.	(1)	ආදායම්	**17,205,635**	**1,796,938**
		අඩු කළා : විකුණුම් පිරිවැය		
		ආරම්භක තොගය	6,750,201	1,819,765
		මිලදී ගැනීම්	22,071,179	5,846,246
		එකතු කළා : තොග උෆනතා / මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	(16,797)	(24,279)
		අඩු කළා : අවසාන තොගය	(16,243,660)	(6,750,201)
		විකුණුම් පිරිවැය	**12,560,923**	**891,531**
		(-) සමාජ ආරක්ෂණ බද්ද	**218,749**	**22,462**
		දළ ලාභය	**4,425,963**	**882,946**

සටහන අංක 29
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
තක්සේරු වර්ෂය 2024
විලම්භිත බදු ගණනය කිරීම

	ඉදිරියට ගෙනා ශේෂය	බදු පදනම	තාවකාලික වෙනස්කම්	විලම්භිත බදු අගය
දේපළ පිරිවිත උපකරණ				
(ඉඩම් හැර)	827,853,313	250,030,662	577,822,651	Note I. (173,346,795)
මුළු වත්කම්	**827,853,313**	**250,030,662**	**577,822,651**	
පාරිතෝෂික	263,393,881	-	263,393,881	79,018,164
බොල්ණය සඳහා වෙන්කිරීම්	78,848,951	-	78,848,951	23,654,685
ඉදිරියට ගෙන ආ බදු අලාභ	-	-	-	-
මුළු වගකීම්	**342,242,832**	**-**	**342,242,832**	**(70,673,946)**
විලම්භිත බදු වගකීම්	577,822,651	Tax @ 30%	173,346,795	173,346,795
විලම්භිත බදු වත්කම්	(342,242,832)	Tax @ 30%	(102,672,850)	(102,672,850)
ශුද්ධ විලම්භිත බදු වගකීම්	**235,579,819**		**70,673,946**	**70,673,946**

විලම්භිත බදු වියදම්	**70,673,946**
2023 වර්ෂයේ විලම්භිත බදු ආරම්භක ශේෂය	-
වසර තුළ නැවත බඳු අඩුකිරීම්	70,673,946
2024 වර්ෂයේ අවසාන විලම්භිත බදු ශේෂය	70,673,946
විලම්භිත බදු අධි වෙන්කිරීම්	
ප්‍රවර්තන වර්ෂයේ විලම්භිත බදු වෙන් කිරීම්	70,673,946
විශ්‍රාම පාරිතෝෂික වගකීම් ප්‍රතිගණනය කිරීම්	-
	70,673,946

සටහන් අංක 01

දේපල පිරිවිත උපකරණ (ඉඩම් හැර / අස්පෘෂ්‍ය වත්කම් සහ ආයෝජන දේපල ඇතුළත් ව)

2024. 12. 31 දිනට දේපළ පිරිවිතර උපකරණ ලියාහල අගය	1,633,753,313
අඩුකළා: ඉඩම් ප්‍රත්‍යාගණන අගය	(805,900,000)
දේපළ පිරිවිත උපකරණ	827,853,313
අස්පෘෂ්‍ය වත්කම්	-
බදු පදනම මත වත්කම්වල ලියාහල අගය	827,853,313

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. CAM/D/SPC/2024/08 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2025 මැයි 30 දින

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ **2024** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **12** වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (LKAS 01) හි 32 ඡේදය ප්‍රකාරව කිසියම් ප්‍රමිතයක අවශ්‍යතාවයකට හෝ අවසර දී ඇත්නම් මිස කිසිදු වත්කමක් හෝ වගකීමක් එකිනෙකට හිලව් නොකළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.117,473,259 ක මුදල් හා මුදල් සමාන දෑ තුළ රු.10,491,746 ක අයිරාවක් සටහන් කිරීම නිසා මුදල් හා මුදල් සමාන දෑ එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද, බැංකු අයිරාව ජංගම වගකීම් තුළ සටහන් නොවීම නිසා මුළු ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද, සටහන් වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 (LKAS 08) හි 49 (a) ඡේදය ප්‍රකාරව පෙර කාලපරිච්ඡේදයේ වැරදි නිවැරදි කිරීමේදී එම වැරදි වල ස්වභාවය සටහන් මඟින් හෙළිදරව් කළ යුතු වුවද, සංස්ථාව විසින් පෙර වර්ෂයට අදාලව සිදුකර ඇති රු.1,918,370 ක ප්‍රත්‍යාගණන ගැලපීමක් සහ රු.132,990,179 ක ආදායම් බදු ගැලපීමක් පිළිබඳව සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 (LKAS 36) හි 10 (a) ඡේදය ප්‍රකාරව භාවිත නොකරන අස්පෘෂ්‍ය වත්කම් සම්බන්ධයෙන් වාර්ෂිකව හානිකරණ අලාභ පිළිබඳ තක්සේරුවක් සිදු කළ යුතු වුවද, සංස්ථාව විසින් 2020 වර්ෂයේදී මිලදී ගත් රු.1,573,932 ක් වටිනා පරිගණක මෘදුකාංග පද්ධතියක් භාවිතය සඳහා ලබාගත හැකි තත්ත්වයේ නොපැවතුනද, එම වත්කම සඳහා හානිකරණ අලාභ පිළිබඳ පරීක්ෂාකර නොතිබුණි.

(ඈ) නොමිලේ ලබා දී තිබූ රු.2,019,710 ක් වටිනා පොත් පරිත්‍යාග වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා ඇති අතර ලාභයද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) රු.25,021,347 ක තැන්පතු ලැබීම් වල අන්තර්ගත රු.2,304,086 වටිනා තැන්පතු තහවුරු කරගැනීමට අවශ්‍ය සාක්ෂි ලබාදීමට සංස්ථාව අපොහොසත් විය.

(ඊ) ජාතික ලොතරයි මණ්ඩලය විසින් එවන ලද ශේෂ සනාථ කිරීමෙහි සඳහන් වූ ණයගැති ශේෂය රු.164,056,839 ක් වූ අතර සංස්ථාවේ ගිණුම්වල එම ණයගැති වටිනාකම රු.271,259,608 ක් ලෙස සඳහන්ව තිබුණි. වෙනස වූ රු.107,202,769 ක වටිනාකම සඳහා ශේෂය නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 757 (2)	ඌණතා හා නැතිවීම් සම්බන්ධයෙන් ගනන්දීමේ නිලධාරියා විසින් ක්‍රියාකල යුතු වුවත් රු.1,0227,793 ක් වූ අමතර කොටස් හා දෘඩාංග තොග ඌණතාවය සම්බන්ධයෙන් එසේ ක්‍රියාකර නොතිබුණි.
(ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක PED 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 (v) පරිච්ඡේදයේ	සංස්ථාව විසින් සේවක කාර්ය සාධනය ඇගයීම කළ හැකි පරිදි දිරිදීමනා යෝජනා ක්‍රමය සකසා රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද එසේ අනුමැතියක් නොමැතිව 2023 වර්ෂයේ රු. 52,572,803.00 ක්ද 2024 වර්ෂයේ රු. 43,651,293 ක්ද මුදලක් දිරි දීමනා ගෙවා තිබුණි. එයට අතිරේකව 2024 වර්ෂයේ සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීමේ අරමුණින් දිරි දීමනා ලෙස එක් සේවකයෙකුට රු. 25,000 බැගින් සේවකයින් 478 කට රු. 11,950,000 මුදලක් ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 ඡේදයේ (අ) වගන්තිය	ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයන්ගේ වගකීම හා කාර්යභාර්යක් වනුයේ සලකා බලන ප්‍රසම්පාදන ක්‍රියාව සඳහා අරමුදල් ලැබෙන බවට සහතික වීමයි. මාර්ගෝපදේශ නොසලකා කටයුතු කිරීම නිසා සංස්ථාව විසින් D/s Art papers මෙට්‍රික් ටොන් 150 ක් ආනයනය කිරීමේදී නාවික ලියවිලි නිදහස් කර ගැනීම සඳහා නියමිත මුදල් ප්‍රතිපාදන නොමැති වීම මත 2024 සැප්තැම්බර් 19 දින ප්‍රමාද ගාස්තු ලෙස පුද්ගලික සමාගමක් වෙත රු.332,391 ක මුදලක් ද මෙට්‍රික් ටොන් 450 ක කඩදාසි මිලදී ගැනීම වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු. 246,152 ක මුදලක් ලෙස එකතුව රු.578,543 ක මුදලක් ගෙවා තිබුණි.

2.3 **වෙනත් කරුණු**

(අ) ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ වලට පටහැනිව 2023 වර්ෂයේ මිලදීගෙන තිබුණ, රු. 1,400,700 ක් වටිනා Carbon Vanes 14 ක් නිසි පිලිවිතරයන්ට අනුකූලබව තහවුරු කරනොගෙන භාණ්ඩ මිලදීගෙන 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාද, භාවිතයට නොගෙන ගබඩාවේ පැවතුණි.

(ආ) වටිනාකම මිලියන 400 ඉක්මවන ප්‍රසම්පාදනයන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවක් හරහා සිදුකලයුතු වුවද, සංස්ථාව විසින් රුපියල් 770,934,430 ක් වටිනා ප්‍රසම්පාදන 9 ක්, මාස දෙකයි දින 10 ක් පමණ වූ ඉතා කෙටි කාලයක් තුළ සිදුකර තිබුණි.

(ඇ) විවිධ කඩදාසි වර්ග ප්‍රසම්පාදනයේදී ඒවායේ නියැදියක් තාක්ෂණික කමිටුව විසින්, සැපයුම්කරු එවනු ලබන වාර්තාව පමණක් පරීක්ෂා කරමින් මිලදී ගැනීමට අනුමත කර තිබුනු අතර සංස්ථාව විසින් කඩදාසි ලැබීමෙන් පසු ගුණත්වය නැවත පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණි.

(ඈ) සංස්ථාව විසින් මුද්‍රණය කරනු ලබන විභාග ප්‍රශ්න පත්‍ර ගබඩා කිරීමට ඉඩකඩ නොපවතින බැවින් වර්ග අඩි 1000 ප්‍රමාණයෙන් යුතු තාවකාලික කුටියක් (Hut) කුලියට ගෙන තිබුණි. සංස්ථාවේ ඇති ගොඩනැගිලි වල ඉඩකඩ පරීක්ෂා කිරීමේදි ප්‍රදර්ශනාගාර ගොඩනැගිල්ල තුළ වර්ග අඩි 2000 ක පමණ ප්‍රමාණයක් වසර ගණනාවක් පැරණි භාවිතයට ගත නොහැකි පොත් ගබඩා කර ඇති බව නිරීක්ෂණය විය. මෙම පොත් සුදුසු පරිදි අපහරණය කලේ නම් අවශ්‍ය ඉඩකඩ ප්‍රමාණය ලබා ගැනීමට හැකිව තිබුණු අතර එසේ කටයුතු කිරීමට කළමනාකාරීත්වය අපොහොසත් වීම නිසා සංස්ථාවට රු. 796,500 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(ඉ) 2024 වර්ෂයේ සංස්ථාව විසින් ක්‍රවුන් (crown) අභ්‍යාස පොත නිෂ්පාදනය කර ඇති අතර මෙම පොත් 200,000 ක් මුද්‍රණය කිරීමට අදාළ කිසිදු සැලැස්මක් හෝ වෙළඳපල සමීක්ෂණයක් හෝ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි. ඒ අනුව මුද්‍රණය කර ඇති පොත් වලින් සියයට 27 ක් පමණක් 2024 දෙසැම්බර් 31 දිනට අලෙවි වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු. 6,119,563ක් වූ පොත් 48,251 ක ප්‍රමාණයක් අළෙවි නොකර ගබඩාවේ පැවතුණි.

(ඊ) සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ උපායමාර්ග සැලැස්මට අනුව අලෙවි ආදායම රුපියල් රු.මිලියන 1014 ක ඉලක්කයක් සැලසුම්කර තිබුණි. එසේ වුවද, අලෙවි අංශයේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව එම ආදායම රු.මිලියන 700 ක වටිනාකමක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සත්‍ය විකුණුම් ආදායම රු.289,147,344 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අලෙවි අංශයේ ඉලක්ක සපුරා ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. අලෙවි අංශයේ උප අංශයක් වන ප්‍රකාශන අංශය සඳහා අලෙවි ඉලක්ක ලබා දී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු. 890,841 ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණි. තවද, මෙම අංශයේ කාර්යය මණ්ඩලයට වැටුප් හා දීමනා ලෙස රු. 1,365,100 ක් ගෙවා තිබුණි. ඒ අනුව කලමනාකරණය විසින් ප්‍රකාශන අංශයේ ඉහළ කාර්යය සාධනයක් අත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ජංගම වගකීම් යටතේ ගෙවිය යුතු බදු ලෙස දැනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අවලංගු කර ඇති බදු වර්ග වන රු.23,342,409 ක ආර්ථික සේවා ගාස්තු සහ රු.80,840,239 ජාතිය ගොඩ නැගීමේ බදු හා රු.126,300 ක රඳවා ගැනීම් බදු වටිනාකමක්

අඛණ්ඩව 2021 වර්ෂයේ සිට නොවෙනස්ව පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව සංස්ථාව විසින් මෙම ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ණයගැති ශේෂය රු.618,417,892.40 ක් වූ අතර එම මුළු වෙළඳ ණයගැති ශේෂයෙන් රු.477,425,985 ක වෙළඳ ණය ගැති ශේෂයන්ට අදාලව ශේෂ සනාථන ලැබී තිබුණේ රු. 271,259,608 ක වෙළඳ ණයගැති වටිනාකමකට පමණි. එමෙන්ම මෙම මුළු වෙළඳ ණයගැති ශේෂය තුල වසර 4 - 10 ත් අතර කාල පරාසයක සිට පැවත එන රු.169,009,992 ක ණයගැති ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2023 වර්ෂයේ රු.8,323,244,160 ක් වූ සංස්ථාවේ ආදායම 2024 වර්ෂය වනවිට රු.2,788,555,974 දක්වා අඩු වී තිබුණි. මෙම ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 66 ක ප්‍රමාණයකින් පහත වැටීමක් සිදු වී තිබුණි. මෙයට හේතු ලෙස සංස්ථාව විසින්, අභ්‍යාස පොත් මුද්‍රණය මත පමණක් සීමා වී වෙලදපළ අවශ්‍යතා හඳුනාගෙන එයට ගැළපෙන පරිදි ගුණත්වයෙන් යුත් භාණ්ඩ නිෂ්පාදනය සිදු නොකිරීම මෙන්ම විකුණුම් වර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීමද ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. මේ හේතුවෙන් ශුද්ධ ලාභ අනුපාතයද සියයට 22 කින් අඩු වී තිබුණි.

ජී.එච්.සී ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

2024

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

1.2

අ) මුදල් හා මුදල් සමාන වත්කම් ගිණුම්වල පෙන්නුම් කිරීමේදී සටහන් අංක 20 දක්වා ඇති ආකාරයටම මූල්‍ය තත්ව ප්‍රකාශයේ අදාළ ශේෂය පෙන්නුම් කිරීමට කටයුතු කර ඇත. අදාළ සටහන සකස් කිරීමේදී බැංකු අයිරා ශේෂය සැළකිල්ලට ගෙන ශුද්ධ අගය පෙන්නුම් කිරීමෙන් මෙය පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත් සංස්ථාවේ ශුද්ධ වත්කම් වල අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නිවැරදිව පෙන්නුම් කර ඇත. ඉදිරි ගිණුම් සකස් කිරීමේදී LKAS 32 පරිදි මුදල් සහ මුදල් සමාන දෑ නිරූපණය කිරීමට කටයුතු කරමි.

ආ) 2023 වර්ෂයට අදාළව විගණනය විසින් පෙන්වා දුන් ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමේදී ඊට අදාල ජ'නල සටහන් මගින් අදාළ ගිණුම් වලට ගැලපීම් සිදු කරන ලදී. එමෙන්ම 2023 වර්ෂයේදී බදු ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් අධි බදු තත්වයන් වාර්තා වූ හෙයින් එම අධි බද්ද 2024 බදු සමග ගැලපීමේදී එය ආදායම් ප්‍රකාශයේ සහ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය තුලින් 2024 වර්ෂයේ නිවැරදි දත්තයන් පෙන්නුම් කිරීමේ අරමුණින් සිදු කරන ලදී. ඒ අනුව එය වෙනම සටහනකින් දැක්වීමට කටයුතු නොකළ අතර ඉදිරි ගිණුම් සකස් කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිති අනුව ගිණුම්කරණ සටහන් තුලින් පෙන්නුම් කිරීමට කටයුතු කරමි.

ඇ) සංස්ථාව විසින් 2020 වර්ෂයේ මිලදී ගන්නා ලද ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ පද්ධතියේ (ERP) පැවති යම් යම් දුර්වලතා හේතුවෙන් එය ඵලදායීව භාවිතා කළ නොහැකි විය. ඒ සඳහා කොටස් මුදලක් පමණක් මෙම මුදල නියෝජනය කරන අතර මෙම පද්ධතියේ ඵලදායී ජීවකාලය තක්සේරු කිරීමට නොහැකි වීම හේතුවෙන් LKAS 36 පරිදි මෙය අස්පෘෂ වත්කමක් ලෙස හානිකරණ ක්‍රියාවලියට ඇතුලත් නොකරන ලදී. මෙය සංස්ථාවේ සියළු අංශ ආවරණය වන පරිදි භාවිතා කිරීම සඳහා නැවත සළකා බැලීමට අදාල SLT ආයතනය සමග තොරතුරු තාක්ෂණ සන්නිවේදන ආයතනයේ උපදෙස් පරිදි කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව ඉදිරියේදී LKAS 36 පරිදි කටයුතු කරමි.

ඈ) 2023. 08. 29 දින 830 වන අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡාවේ ගන්නා ලද තීරණයට අනුව පිරිවෙන් හා පාසල් සඳහා පරිත්‍යාග කිරීමට නිර්දේශ කර තිබූ ප්‍රකාශන සියල්ලෙහි වටිනාකම ශුන්‍ය කර ඇත. ඒ අනුව ගිණුම්ගත කිරීම සඳහා මෙම තොගය අදාල නොවේ. ඒ නිසා ලාභයට බලපෑමක් නොමැත.

ඉ) ශේෂ සනාථ ලබා ගැනීම සඳහා සංස්ථාව විසින් විධිමත් ලෙස ලිපි සකස් කර අදාළ ණය ගැතියන් වෙත ලිපි යැවීමට කටයුතු කර ඇත. ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සනාථ කර තිබූ ශේෂය රු. මි. 164.056839 ක් වුවත් සංස්ථාව විසින් ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි වර්ග 07 ම සංස්ථාව විසින් එම වර්ෂයේ 3 වන කාර්තුවේ මුද්‍රණය කිරීමෙන් ඒ සඳහන් මිල ගණන් අනුමත වූ පසු 2024 නොවැම්බර්/දෙසැම්බර් මාසවල විශාල වශයෙන් ඉන්වොයිස් කිරීමත් මත මෙම ශේෂය සංස්ථා ගිණුම්වල වාර්තා කරන ලදී. එම වටිනාකම් මේ වන විට අදියර වශයෙන් නිරවුල් කර ගැනීමට කටයුතු කර ඇත.

02) 2.2

අ) ප්‍රධාන ගබඩාවේ සිදුවී ඇති භාණ්ඩ ද්‍රව්‍ය ඉල්ලුම් හා භාණ්ඩ ලැබීම් පත් බින් කාඩ්පත් වල සටහන් කිරීමේදී සිදුවී ඇති දුර්වලතා හේතුවෙන් මෙම ඌණතාවය වාර්තා වී ඇති අතර සංස්ථාවේ ගිණුම් සකස් කිරීමේ ක්‍රමවේදය අනුව තොග ගැලපීම් සිදු කරනු ලබන්නේ අදාළ උප නිෂ්පාදන ගිණුම් තුලය. එම නිසා තොග ඌණතාතාවය තොග ගැලපීම් වලටම අදාළ කොටසේ

සිදු කරයි. මේ සම්බන්ධයෙන් සිදු කරනු ලබන පරීක්ෂණ අනුව අදාල ඌණතාවය අයකර ගැනීමත් හෝ සම්බන්ධ තීරණය අනුව තොග ශේෂයන්ට අදාළ හිඟය ගිණුම් වල වාර්තා කිරීමට කටයුතු කරමි. ඊට අදාළ පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත.

ආ) රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව 1968 වර්ෂයේ ආරම්භ කර ඇති අතර සංස්ථාව ආරම්භයේ සිටම එහි සේවක මණ්ඩලය වෙත වාර්ෂිකව සේවකයන් අභිප්‍රේරණය කිරීමේ අරමුණින් මාසික වැටුප් 02 ක දීමනාවක් දෙසැම්බර් මාසයේදී ගෙවීමට කටයුතු කර ඇත.

මෙම තත්වය සංස්ථාව ආරම්භයේ සිටම ලාභ ලබන අවස්ථාවන් වලදී මෙන්ම අලාභ ලැබූ අවස්ථාවන් වලදී ද ඊට වඩා අඩු දීමනාවක් ද අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් යුතුව ලබා දීමට කටයුතු කර ඇත. එමෙන්ම සේවක මණ්ඩලය මෙම දීමනාව ලබා ගැනීමට අදාළ මාසයේදී අපේක්ෂාවෙන් සිටින අතර ඔවුන් විසින් ද අදාල ප්‍රතිලාභය ලබා ගැනීමට සාමූහිකව ඉල්ලීම් කරනු ලබයි.

2023 වර්ෂයේ සංස්ථාවේ සේවකයින් 2023 සහ 2024 වර්ෂ වලට අදාළව පෙළපොත් මුද්‍රණය මගින් සංස්ථාවට සුවිශේෂී ලාභයක් සපයා දීමට සමත්වූ බැවින් සේවක මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අනුමැතිය සහිතව මෙම දීමනාව ගෙවීමට කටයුතු කර ඇත.

මෙම ගෙවීම 2023 වර්ෂයේ ලාභයෙන් 1.8 % කි. එය හුදෙක්ම සේවකයන් විසින් සංස්ථාවේ ප්‍රගතිය වෙනුවෙන් සිදු කරනු ලැබූ කැප කිරීම උදෙසා සේවකයින් අගය කිරීමක් ලෙස සලකා එවකට සිටි සභාපතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගෙවීම සිදු කර ඇත.

2024 වර්ෂයේ දෙසැම්බර් මාසයේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ 1, 6 සහ 10 ශ්‍රේණි පෙළපොත් මුද්‍රණය හදිසි කටයුත්තක් සේ සළකා සිදු කළද සේවකයින්ගේ ප්‍රසාද දීමනා ඉල්ලුම් කරමින් සියළු සේවකයින් වෘත්තීය සමිති ලෙස ඒකරාශී වී කළමණාකාරීත්වයට කේවල් කරමින් මෙම ඉල්ලීම සිදු කරන ලදී.

2024 වර්ෂයේදී සංස්ථාව විසින් සියළුම බාහිර බැරකම් පියවා මූල්‍ය ලාභයක් වාර්තා කරන ලදී. විශේෂයෙන් වාණිජ මුද්‍රණ අංශය සහ ලොතරැයි මුද්‍රණ අංශය අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට හැකි වීමත් ඒ තුළින් වැඩ අංශයේ සේවක මණ්ඩලය පූර්ණ වශයෙන් නිෂ්පාදන කටයුතු සඳහා යෙදවීමටත් හැකියාව ලැබිණි. ඒ අනුව එම ඉල්ලීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සළකා බලා සේවක අභිප්‍රේරණ දීමනාවක් ලෙස සංස්ථාව ලබාගෙන ඇති ප්‍රගතියද සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව මෙම දීමනාව ගෙවා ඇත.

අදාළ ගෙවීම සිදු කිරීමට පෙර සටහනක් මගින් අමාත්‍ය මණ්ඩලය සහ අගමැතිතුමිය සහ ප්‍රධාන ගණන්දීමේ නිළධාරී ද දැනුවත් කිරීමෙන් අනතුරුව එම ගෙවීම සංස්ථාව ලබාගෙන ඇති ප්‍රගතිය සහ සේවකයින් සිදුකරන ලද මෙහෙය වෙනුවෙන් සේවකයන් වෙත සංස්ථාව මගින් ලබාදෙන ලද ත්‍යාගයක් ලෙස ලබා දීමට කටයුතු කර ඇත. එමෙන්ම 2025 වර්ෂයේ සිට KPI මත පදනම්ව සකස් කරනු ලබන ක්‍රමවේදයක් අනුව දිරි දීමනා ක්‍රමයක් හඳුන්වා දීමටත් කටයුතු කරනු ලබන බව වැඩිදුරටත් දැනුම් දෙමි.

සංස්ථාවේ සේවකයන්ට 2024 වර්ෂයේ සිංහල අළුත් අවුරුද්ද සඳහා යම් සුභසාධනයක් සිදු කිරීමේ අරමුණින් සහ අභිප්‍රේරණය කිරීමේ අරමුණින් සංස්ථා පනතේ 5 වන කොටසේ ප්‍රතිපාදන අනුව (C&I) සහ සංස්ථා සේවකයන් වෙත සුභ සාධනය සම්බන්ධයෙන් අවම පහසුකම් පවතින බැවින් ඒ පිලිබඳව සළකා බලා අභිප්‍රේරණ දීමනාවක් ලෙස මෙම දීමනාව අප්‍රේල් මාසයේදී ගෙවීමට කටයුතු කර ඇත.

2.2

අ) නිෂ්කාශන නියෝජිත ආයතනය තෝරා ගැනීමට අදාළ ප්‍රසම්පාදනයේදී සහ ඔවුන් වෙත ඇණවුම ලබා දීමේදී ප්‍රසම්පාදනයේදී එකඟවූ සේවාවන් සඳහා පමණක් ගෙවීමට සංස්ථාව විසින් එකඟ වී ඇත. ඒ අනුව සංස්ථාව විසින් මෙම සේවාව සඳහා ගෙවීමට එකඟතාවය පල කර නැත.

D/S Art Paper - 150 M/Tons සහ මුද්‍රණ කඩදාසි මෙ.ටො. 450ක් ආනයනය කිරීම

ඉහත D/S Art Paper - 150 M/Tons කඩදාසි තොගය වරායට ලඟා වී ඇත්තේ 2024. 09. 13 දිනය. එදිනම තොගය නිෂ්කාෂණය සඳහා අවශ්‍ය නාවික ලියවිලි සකස්කර බැංකුගත කර ඇත. නමුත් ඒ සඳහා ණය අනුමත වී නොතිබුණි. 2024. 09. 18 දින නාවික ලියවිලි වල මුල් පිටපත් බැංකුව වෙත ලැබී ඇති අතර 2024. 09. 19 දින ණය අනුමත වී ඇත. එදිනම නාවික ලියවිලි බැංකුවෙන් නිදහස් කර ගැනීමට ගිය ද ඒවා නිදහස් කරන ලද්දේ 2024. 09. 20 දින ප. ව. 1.45ට පමණය. 2024. 09. 21 දින පැවැත්වීමට නියමිත ජනාධිපති මැතිවරණය හේතුවෙන් ආයතන 20 දින කල්තියා වසා දමන ලදී. එදින සිකුරාදා දිනයකි. ඊලඟට එළඹුණු සඳුදා දිනය රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම නිසා ආයතන වසා තැබීම යන ආදී කරුණු මත එකී තොගය නිෂ්කාශනය කරගැනීම ප්‍රමාද විය. 2024. 09. 24 දින තොගය නිෂ්කාශනය සිදුකර ඇති බවද පෙරකී කරුණු හේතුවෙන් ගාස්තුවක් ගෙවීමට සිදුවී ඇති බව දන්වනු කැමැත්තෙමි.

2.3

අ) සංස්ථාවේ ආපදාවට ලක්ව ඇති වැකුම් පම්ප් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා Carbon Vanes මිලදී ගැනීමේදී අදාල කළමණාකාරීත්වයේ, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය පරිදි නියෝජිත ආයතනයෙන් මිලදී ගෙන ඇත.

SORS, Man Roland සහ Cover Pasting යන යන්ත්‍ර 3 පාසල් පෙල පොත් මුද්‍රණය, අභ්‍යාස පොත් මුද්‍රණය සහ අනිකුත් මුද්‍රණ සඳහා ඍජුවම දායකත්වයක් දක්වන යන්ත්‍ර වේ. තවද මෙම යන්ත්‍ර අප ආයතනයේ ප්‍රමුඛතා ලයිස්තුවට අයත් යන්ත්‍ර (Critical / Bottleneck) වන අතර එම යන්ත්‍ර අක්‍රිය උවහොත් ආයතනයේ නිශ්පාදන ක්‍රියාවලිය සම්පූර්ණයෙන් අඩාල වේ.

SORS, Man Roland සහ Cover Pasting යන යන්ත්‍ර 3 ම Busch වර්ගයේ වැකුම් පම්ප් 3 ක් අන්තර්ගත වේ. එම එක් වැකුම් පම්ප් යන්ත්‍රයක් අලුත්වැඩියා කිරීම සඳහා Carbon Vanes 7 ක් අවශ්‍ය වන අතර යන්ත්‍ර 3 ම අලුත්වැඩියා කිරීම සඳහා Carbon Vanes 21 ක් අවශ්‍ය වේ.

යන්ත්‍ර නඩත්තු කිරීම යනු යන්ත්‍ර බිඳ වැටීමකින් තොරව අඛණ්ඩව නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදවීමයි. එය නඩත්තු අංශයේ ප්‍රධාන කාර්යය වේ. යන්ත්‍ර ආපදාවකට පත්වූ පසු අමතර කොටස් ඇනවුම් කිරීම අප වැනි නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදී සිටින ආයතනයකට කිසිසේත් ප්‍රායෝගික නොවන අතර ආපදාවට ලක්වීමට පෙර යන්ත්‍ර අලුත්වැඩියා කිරීම (Preventive Maintenance) නඩත්තු අංශයේ ප්‍රධාන කාර්යය වේ.

පාසල් පෙලපොත් මුද්‍රණය වසරකට එක් වතාවක් සිදු කරන අතර සාමාන්‍යයෙන් මාස 5 ක් වැනි කෙටි කාලයක් තුල අවසන් කල යුතු වේ. යම් හෙයකින් ඉහත සඳහන් යන්ත්‍රවලට හානියක් සිදු වුවහොත් මෙම යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට අදාල Carbon Vanes මිලදී ගැනීමට දීර්ඝ කාලයක් ගත වේ. එවැනි අවස්ථාවක් උද්ගත වුවහොත් ආයතනයට සිදුවන පාඩුව විශාල වන අතර පාසල් පෙල පොත් මුද්‍රණයේ ප්‍රමාද ගාස්තු වශයෙන් දඩ මුදල් ගෙවීමට ද සිදුවේ.

මෙම වැකුම් පම්ප් යන්ත්‍රය Busch වර්ගයේ වන අතර එහි නිෂ්පාදිත ආයතනයේ වෙබ් පිටුවෙහි (www.buschvacuum.com) සඳහන් පරිදි අව්‍යාජ අමතර කොටස් (Genuine Spare Parts) තහවුරු කර ගැනීමට අවශ්‍ය නම් එහි Dimension, Part No සහ Brand අපට ලැබී ඇති Carbon Vanes සමග පහත පරිදි සන්සන්දනය කල යුතුය.

1. Dimensions : 170-44-4 mm
2. Rico CNC replacement for Busch pump Vanes 0722000017
3. For Busch Vacuum pumps

Busch වැකුම් පම්ප් (Model) (DC 0080 B වර්ගයේ වැකුම් පම්ප් සඳහා Carbon Vanes 7 ක් අවශ්‍ය බව තහවුරු කර ගන්නා ලදී. (7 Carbon Vane set)

එක් Carbon Vanes එකක දිග, පලල, උස 170 × 44 × 4 mm සඳහන්ව ඇති අතර ලැබී ඇති Carbon Vane වල දිග පලල උස ඊට සමාන වීමෙන් එය නිවැරදි බව තහවුරු කර ගන්නා ලදී.

මීට අමතරව යන්ත්‍රවල අමතර කොටස් නිවැරදි යයි තහවුරු කර ගැනීමට අවශ්‍ය නම් එය තහවුරු කර ගන්නා එකම සහ නිවැරදිම ක්‍රමය වනුයේ එහි Part no. එක අමතර කොටසෙහි සඳහන්ව තිබේ දැයි පරීක්ෂා කිරීම.

එම අමතර කොටසේ Part No එක වෙබ් පිටුවට අනුව 0722000017 ලෙස සඳහන්ව ඇති අතර ලැබී ඇති Carbon Vanes වලද මෙම Part No එක සඳහන්ව ඇති බැවින් එය නියෝජිත ආයතනයෙන්ම සපයා ඇති Genuine Spare Parts එකක් ලෙස නිර්නය කල හැක.

මෙම Carbon Vanes යොදා වැකුම් යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතී.

ආ, ඇ

2024 වර්ෂයේ දී සිදුකරන ලද ජාතික ප්‍රසම්පාදන 15ක් සඳහා ලංසු තැබීමේ කාල සීමාව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 හි සඳහන් පරිදි දින 21ක කාලයක් ලබාදී ඇත.

ජාතික තරඟකාරී ලංසු කැඳවීම මත ආනයන කඩදාසි සඳහා ලංසුකරු තෝරාගත් පසු ඔවුන් වෙත අදාල පිරිවිතර සමග ඇණවුම ප්‍රධානය කරන ලද අතර එකී පිරිවිතර අනුව නිෂ්පාදනය කර අමුද්‍රව්‍ය සැපයීමට සැපයුම්කරු විසින් ලංසු ලේඛණය හරහා ගිවිසුම්ගත වී ඇත.

නිෂ්පාදනය කළ පසු එකී කඩදාසි පිරිවිතර වලට අනුකූල ද යන්න නැවිගත කිරීමට පෙර ලොව පිළිගත් අපක්ෂපාතී අන්තර් ජාතික සුපරීක්ෂණ ආයතනක් වන SGS (Société Générale de Surveillance) ආයතනය වෙතින් පූර්ව පරීක්ෂාවක් කර එකී වාර්ථාව පලමුව අප සංස්ථාව වෙත සෘජුවම විද්‍යුත් තැපෑලෙන් එවනු ලබයි. එම වාර්තාව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පරීක්ෂා කිරීමෙන් පසුව පමණක් සැපයුම්කරුට කඩදාසි නැවිගත කිරීමට අවසර ලිඛිතව ලබාදෙන අතර SGS ආයතනය විසින් එකී කඩදාසි ඇතුලත් බහාලුම් මුද්‍රා තබයි. මෙම ක්‍රියාවලිය ඉතාමත් විශ්වාසදායී / ආරක්ෂාකාරී හා හොඳම ක්‍රමවේදය ලෙස පෙන්වා දීමට කැමැත්තෙමි. අනෙකුත් රජයේ ආයතන ද මෙම ක්‍රමවේදය අනුගමනය කරන බව දන්වමි.

මෙම අමුද්‍රව්‍ය යොදා මුද්‍රණය කරන පොත් වල නියැදි පරීක්ෂාවක් ගැණුම්කරු විසින් සිදුකර නිර්දේශය ලැබුණු පසු මුද්‍රණය සිදු කරයි. පසු පරීක්ෂා කිරීම් ද අදාල ගැණුම්කරු විසින් සිදු කරයි. පූර්ව SGS වාර්තාවක් මගින් නිෂ්පාදනය කරන ලද කඩදාසි පිරිවිතර හා ගැලපෙන බව සනාථ කිරීමෙන් පසු එකී කඩදාසි සැපයීම සිදුකරන නිසා කඩදාසි වල ගුණාත්මක භාවය සම්බන්ධව කිසිදු පැමිණිල්ලක් මෙතෙක් ලැබී නැත.

පෙළපොත් මුද්‍රණය අරමුණු කරගෙන අමුද්‍රව්‍ය ඇණවුම් කිරීම සිදුකරන බැවින් පෙළපොත් සඳහා කැබිනට් අනුමැතිය ලැබීමට අපේක්ෂිත පෙළපොත් සඳහා පූර්ව ප්‍රසම්පාදන සැලැස්මක් හා ඇස්තමේන්තු සකස් කරයි. ඉන්පසු නිෂ්පාදන අංශ සමග සාකච්ඡා කර නිෂ්පාදන සැලස්මක් සකස් කරයි. එම සැලැස්මට අනුව යන්ත්‍ර භාවිතය හා එක් එක් පොත් වර්ගය අනුව අමුද්‍රව්‍ය ඇණවුම් කරයි.

බැංකුව විසින් සංස්ථාව වෙත ලබාදී ඇති අරමුදල් සීමාව රු.මිලින 900ක් වන අතර එය ලබා දෙන්නේ ද කොටස් වශයෙනි.

අමුද්‍රව්‍ය එකවර ඇණවුම් කිරීමේදී ණයවර ලිපි විවෘත කරගැනීම සඳහා මෙම මූල්‍ය පහසුකම් හා මේ වනවිට පවතින සීමාවන් සහ අමුද්‍රව්‍ය අවශ්‍යතාවය සහ ගබඩා පහසුකම් ද සලකා බලා ඇණවුම් කිරීමට සිදුවේ. ඒ අනුව කොටස් වශයෙන් ඇණවුම් කිරීමට සිදුවන බව දන්වනු කැමැත්තෙමි.

ඈ) ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාව මගින් අභ්‍යාස පොත් ඇතුලු ලිපිද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සිදු කරන අතර, පොත් බැඳීම් අංශය විසින් පාසල් පෙළ පොත් නිෂ්පාදනය කරන කාල වකවානු වලදී පමණක් පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වලට අයත් අවසන් වාර විභාග ප්‍රශ්න පත්‍ර ඇසිරීමේ හා බෙදා හැරීමේ කටයුතු සිදු කරනු ලබයි.

විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණ කටයුතු දැඩි ආරක්ෂාවක් යටතේ සිදු කල යුතු අතර එහිදී ලිතෝ අංශය මගින් මුද්‍රණය කිරීමෙන් පසු ආරක්ෂක නිලධාරීන්ගේ ආරක්ෂාව යටතේ මුද්‍රිත ප්‍රශ්න පත්‍ර ලිපිද්‍රව්‍ය අංශය වෙත ගෙන ඒම සිදු කරයි.

ඉන්පසු ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවේ වර්ග අඩි 8400 ක ඉඩ ප්‍රමාණය භාවිතයෙන් ප්‍රශ්න පත්‍ර විෂයන් හා පාසල් අනුව පාර්සල් කිරීම සිදු කරන අතර සියලුම විෂයන් හා ශ්‍රේණි වලට අයත් ප්‍රශ්න පත්‍ර ප්‍රමාණයන් අනුව පාර්සල් කර අවසන් වූ පසු ඒවා පාසල් අනුව ගොනු කිරීම සිදු කරයි. එසේ ගොනු කරන තෙක් ප්‍රශ්න පත්‍ර පැකට් තාවකාලිකව ගබඩා කර තබා ගන්නා අතර

ඒ සඳහා ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී පමණක් වර්ග අඩි 1000 ක පමණ තාවකාලික හට් එකක් සෑම පසෙකින්ම ආවරණය වනසේ ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවට සම්බන්ධ කර සකස් කරනු ලබයි.

විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කර බෙදා හැරීම ඉතා කෙටි කාලයක් තුල අවසන් කල යුතු කාර්යයක් වන අතර ප්‍රශ්න පත්‍ර පාර්සල් කර තාවකාලිකව ගබඩා කිරීම සහ ගබඩා කර තිබූ ප්‍රශ්න පත්‍ර පැකට් අවශ්‍ය පරිදි නැවත ගෙන පාසල් අනුව ගොනු කර මලු කිරීම සිදු කරන බැවින් තාවකාලිකව ගබඩා කරන ස්ථානය ලෙස ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවෙන් පරිභාහිරව ඇති උක්ත විගණන වාර්තාවේ සඳහන් කර ඇති ප්‍රදර්ශනාගාර ගොඩනැගිල්ල භාවිතා කිරීම ප්‍රායෝගිකව සිදු කල නොහැකිය. තවද එසේ වෙනත් ස්ථානයකට රැගෙන යාම සහ රැගෙන ඒමට අමතරව විශාල කාලයක් ගතවන අතර එම නිසා එකී ගොඩනැගිල්ලේ ඇති ප්‍රකාශන සහ අනෙකුත් ද්‍රව්‍ය ඉවත් කර ගොඩනැගිල්ල හිස් කර ලබා ගැනීම සිදු කල ද ප්‍රශ්න පත්‍ර වල ආරක්ෂාව ඇතුලුව පැන නැගෙන ප්‍රායෝගික ගැටලු නිසා ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවෙන් පරිභාහිර වෙනත් ස්ථානයක ප්‍රශ්න පත්‍ර පැකට් තාවකාලිකව ගබඩා කිරීම සිදු කල නොහැකිය. ඒ හේතුවෙන් ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවේ ප්‍රශ්න පත්‍ර ඇසුරුම් කිරීම සහ බෙදා හැරීම සිදු කරන සමහර අවස්ථාවලදී පමණක් (6-11 ශ්‍රේණි සියල්ලම සඳහා මුද්‍රණය කරන අවස්ථා වලදී) තාවකාලික කුටිය සම්බන්ධ කිරීම අනිවාර්යෙන් සිදු කල යුතුය. ඒ අරමුණු සහිතව මෙම ආවරණ කුටිය සකස් කරන ලදී.

ඉ) මෙම නිෂ්පාදනයේ නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමේ අරමුණින් සෘජුව සිදුකර ඇත. එමෙන්ම පාසල් පෙළපොත් මුද්‍රණ යන්ත්‍රයෙන් අභ්‍යාස පොත් මුද්‍රණය කිරීම නව ව්‍යාපෘතියකි.

ක්‍රවුන් පොත් 40% වට්ටම් යටතේ විකිණීමෙන් 12.5% ලාභාංශය නැති වී ඇති අතර ලාභ හෝ පාඩු නොලබන තත්වයට පත්ව ඇත. ඉදිරියේදී වට්ටම අඩු කර සියලුම පොත් විකිණීමට අලෙවි අංශය විසින් සැළසුමක් සකස් කර ඇත. ඒ සඳහා ප්‍රමුඛතාවය දී කටයුතු කරනු ලැබේ.

ඊ) සමාලෝචිත වර්ෂයේ අවසන් පාසල් වාරය 2025 වර්ෂයේ මුල් කාර්තුව තෙක් දිගුවීම, වෙළඳපොළ තුල නව තරඟකාරී ලිපිද්‍රව්‍ය නිෂ්පාදන ආයතන බිහිවීම, ඉහතින් සඳහන් කළ ආකාරයෙන් ලිපිද්‍රව්‍ය වල ලකුණු කල මිල වැඩිවීම යන කරුණු මත ඉහත රු. මිලියන 700 ක අලෙවි ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වූ බව සඳහන් කරමි. වර්තමානයේ අනෙකුත් තරඟකාරී ලිපිද්‍රව්‍ය නිෂ්පාදන ආයතනයන්හි ලකුණු කල මිලට සාපේක්ෂව අවම ලකුණු කල මිල සටහන් කරමින් හා සියළු අලෙවිකරණ උපායමාර්ග යොදා ගනිමින් 2025 වර්ෂයට හිමි අලෙවි ඉලක්ක කරා අලෙවි අංශය මෙහෙයවීම සඳහා අවශ්‍ය සියළු උපදෙස් ලබා දී ඇති බවද කාරුණිකව දන්වා සිටිමි.

උ) ජංගම වගකීම් තුල සටහන් අංක 23 යටතේ දක්වා ඇති ගෙවිය යුතු බදු ලෙස ආර්ථික සේවා ගාස්තු ජාතිය ගොඩනැගීමේ බදු සහ රඳවා ගැනීමේ බදු ගිණුම් වලින් ඉවත් කර ගැනීම සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඊට අදාළ තහවුරුවක් ලබාදෙන මෙන් ඉල්ලමින් ලිඛිතව ඉල්ලීම් කර ඇත. නමුත් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් මේ දක්වා ලැබී නොමැත. කෙසේ නමුත් මෙම ශේෂයන් පිලිබඳව සාකච්ජාවක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සිදු කිරීමට සංස්ථා කළමණාකාරීත්වය තීරණය කර ඇත.

ඌ) සංස්ථාවේ ණය ගැති ශේෂය තුල පවතින මි. 169.009992 ක ශේෂයෙන් 2015 වර්ෂයට පෙර ශේෂ අයකර ගැනීම සම්බන්ධව පවත්නා ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ශේෂ/තොරතුරු පවතින ශේෂ/නීතිමය පියවර ගෙන ඇති ශේෂ සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශ වශයෙන් වෙන්කර ගනිමින් ශේෂයන් අයකර ගැනීමට නොහැකි වීමේ හේතු සහිත වාර්තාවක් විගණන කමිටුවේ උපදෙස් පරිදි අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත යොමු ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධව ඉදිරියේදී ගනු ලබන තීරණ අනුව අයකර ගැනීමට හැකි ශේෂ උපරිම වශයෙන් අයකර ගැනීමටත් අයකර ගැනීමට නොහැකි ශේෂ විධිමත් අනුමැතියක් ලබා ගැනීමෙන් අනතුරුව බොල්ණය ලෙස කපා හැරීමටත් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

එ) 2022 වර්ෂයේදී රටේ පැවති ආර්ථික තත්වය හේතුවෙන් (විදේශ විනිමය අර්බුදය) පෙළපොත් මුද්‍රණ කටයුතු සිදු නොකරන ලදී. 2023 වසරේදී ඉන්දීය ණය යෝජනා ක්‍රමය හරහා අමුද්‍රව්‍ය සංස්ථාවට ලැබීමත් සමගම 2022 වර්ෂයේදී පෙළපොත්ද 2023 මූල්‍ය වර්ෂයේදී පෙළපොත් ද

2023 වර්ෂය තුල මුද්‍රණය කිරීමට අවස්ථාව ලැබීමෙන් 2023 වර්ෂයේදී පෙළපොත් මුද්‍රණ ආදායම දෙගුණ විය. එමෙන්ම උද්ධමනකාරී තත්වය තුළ කඩදාසි මිල ඉතා ඉහළ අගයක් ගැනීමෙන් පෙළපොත් මිල ඉහළ අගයක් වීමත්, ආදායමේ සංඛ්‍යාත්මක වැඩිවීමත් මත ආදායමේ සංඛ්‍යාත්මක වැඩිවීමක් 2023 වර්ෂයේ සිදු විය. නමුත් 2024 සාමාන්‍ය වර්ෂයක් බැවින් 2025 වර්ෂයට අදාල පෙළපොත් ආදායම පමණක් ඉපැයීම මෙන්ම සමස්ථ පෙළපොත් ප්‍රමාණයෙන් එනම් 1, 6 සහ 10 ශ්‍රේණිවල පෙළපොත් හැර 40%ක ප්‍රමාණයක් සංස්ථාවට ලැබීමෙන් මෙම ආදායම අඩුවී ඇත.

2023 වර්ෂයේ විකුණුම් පිරිවැය ප්‍රතිශතය අඩුවීමට හේතුව සේවක පිරිවැය ස්ථාවරව තිබියදී වසර 02 ක පෙළපොත් මුද්‍රණ ඇණවුම් සම්පූර්ණ කිරීමෙන් එක් ඒකකයකට දරනු ලැබූ සෘජු ශ්‍රම පිරිවැය අඩුවීමයි. එනම් සේවක මණ්ඩලයට ගෙවනු ලබන එක් වාර්ෂික වැටුපකින් පෙළපොත් ඇනවුම් 02 ක් සම්පූර්ණ කිරීම හේතුවෙන් වේ. නමුත් 2024 වර්ෂයේදී වැටුප් වැඩිවීම හා 2025 වර්ෂයේදී පෙළපොත් වලින් කොටසක් පමණක් නිෂ්පාදනය කිරීම මත ඒකකයකට දරනු ලබන සෘජු පිරිවැය වැඩිවීමෙන් විකුණුම් පිරිවැය වැඩිවීම සහ දළ ලාභය හා ශුද්ධ ලාභය අනුපාත අඩුවීම සිදු වී ඇත.

2024 ANNUAL REPORT